# වාර්ෂික වාර්තාව සහ ගිණුම්

# வருடாந்த அறிக்கையும் கணக்குகளும

# Annual Reports & Accounts 2017

PGIE
POST GRADUATE INSTITUTE OF ENGLISH


පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ஆங்கில பட்டப்பின்படிப்பு நிறுவகம
இலங்கை திறந்த பல்கலைக்கழகம

POSTGRADUATE INSTITUTE OF ENGLISH
THE OPEN UNIVERSITY OF SRI LANKA

# පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

# වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්

# 2017

# පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

**2005 ඔක්තෝබර් මස 31 දිනැති ගැසට් අති විශේෂ නිවේදන අංක 1417/12හි පළ කරන ලද, 2005 අංක 4 දරන ආඥාපනත මඟින් සහ1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24A වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදන ලද නියෝගය යටතේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ස්ථාපිත කරන ලදී.**

## දැක්ම

**ශ්‍රී ලංකාව තුල ඉංග්‍රීසි භාෂාව අධ්‍යයනය කිරීමේ සහ අධ්‍යාපනය පිළිබඳ පශ්චාද් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණවල නායකත්වය ඉසිලීම හා දේශීය සහ ගෝලීය අවශ්‍යතා සහ ප්‍රවණතාවලට නිර්මාණාත්මක සහ පසුබිමක් සහිතව පිළිතුරු සපයන ප්‍රමුඛතා සඳහා ප්‍රචලිත වීම.**

## මෙහෙවර

**ස්වයං යොමුවක් සහ ස්වයං නිදහස් ඉගෙනීම තුලින් ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය අධ්‍යයනයෙහි පශ්චාද් උපාධි මට්ටමේ අධ්‍යයනය, පර්යේෂණ, ගුරු අධ්‍යාපනය, නව සොයාගැනීම් සහ ඉගෙනීමෙහි විශිෂ්ටතාව සඳහා අවස්ථාව ලබා දීම සහ ජාතික මට්ටමින් ඉංග්‍රීසි භාෂා අධ්‍යාපන ඉදිරියට ගෙන යාම සහ ඊට නායකත්වය සැපයීම.**

# පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය


# සංශෝධිත වාර්ෂික වාර්තාව හා ගිණුම්

# 2017

## අන්තර්ගතය


| | | පිටු අංකය |
|---|---|---|
| **1.** | අධ්‍යක්ෂවරයාගේ හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය පිළිබඳ කෙටි හැඳින්වීම | **4** |
| (අ) | පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සාමාජිකයින් | 4 |
| i) | කළමනාකාරිත්ව මණ්ඩලය | 5 |
| ii) | ඉංග්‍රීසි භාෂාව දෙවන භාෂාව ලෙස ඉගැන්වීම සඳහා වන අධ්‍යයන මණ්ඩලය | 7 |
| iii) | දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම සඳහාවන අධ්‍යයන මණ්ඩලය | 8 |
| iv) | පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩල සාමාජිකයින් | 9 |
| **2.** | අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය | **10** |
| අ) | කෙටි හැඳින්වීම | 10 |
| ආ) | ජයග්‍රහණ | 13 |
| ඇ) | අභියෝග | 20 |
| ඈ) | ඉදිරි සැලසුම් | 21 |
| **3.** | කළමනාකරණ හා පරිපාලනමය ප්‍රගතිය | **26** |
| **4.** | සංශෝධිත මූල්‍ය ප්‍රකාශන (නව ආකෘතියට අනුකූලව) | **44** |
| **5.** | විගණන කමිටුවේ වාර්තාව | **47** |
| **6.** | විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන | **43** |
| **7.** | විගණකාධිපතිවරයාගේ වාර්තාව | **71** |
| **8.** | විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු | **78** |

## 1. අධ්‍යක්ෂතුමා හා ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය පිළිබඳ කෙටි හැඳින්වීම



**(අ)(i)** **පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකාරිත්ව මණ්ඩලයේ සාමාජිකයින්**

| | නම | තනතුරු නාමය |
|---|---|---|
| 1 | ආචාර්ය **එච්.එස්. රඹුක්වැල්ල** | **සභාපති, අධ්‍යක්ෂ/**පශ්චාද් **උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය** |
| *9.1.(ආ) උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ එම විෂය භාර වෙනත් අමාත්‍යංශ ලේකම්වරයෙකු හෝ පත් කළ හැකිය.* | | |
| 2 | **ආර්.පී.ආර්. රණසිංහ මහත්මිය** | **සහකාර අධ්‍යක්ෂ (ශිෂ්‍යත්ව) -** සංවර්ධන **අංශය**<br>**උසස් අධ්‍යාපන හා** මහාමාර්ග **අමාත්‍යාංශය** |
| 3 | **එන්.කේ.ජී.කේ. නැම්මවත්ත මහතා** | **අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය** |
| *9.1.(ඇ) විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශ ප්‍රධානි;* | | |
| 4 | ආචාර්ය **කේ.ආර්.එම්. ද සිල්වා** | **ප්‍රධානි/භාෂා අධ්‍යයනාංශය,** ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල |
| *9.2. (අ) පීඨ සභාවේ නියෝජිතයෙකු* | | |
| 5 | මහාචාර්ය **එන්.ආර්.** අර්ථනායක | **සම්මානිත** මහාචාර්ය**,** ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| *9.2. (ආ) කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මහාචාර්යවරු පස්දෙනෙකු හෝ ඉංග්‍රීසි, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සහ වාග්විද්‍යාව (අදාල වන පරිදි) විෂයයන් ඉගැන්වීම භාර අධ්‍යයනාංශ ප්‍රධානීන්* | | |
| 6 | මහාචාර්ය **නිලූෆර් ද මෙල්** | **ඉංග්‍රීසි භාෂාව පිළිබඳ** ජ්‍යෙෂ්ඨ මහාචාර්ය**, කොළඹ විශ්වවිද්‍යාලය** |
| 7 | මහාචාර්ය **ජේ. මනතුංග** | **සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය, මොරටුව විශ්වවිද්‍යාලය** |
| 8 | මහාචාර්ය **නෙලුක සිල්වා** | මහාචාර්ය**, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය** |
| *9.2. (ඇ) විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයෙකු* | | |
| 9 | මහාචාර්ය **ජේ.සී.එන්.රාජේන්ද්‍ර** | **භෞතිකවිද්‍යාව පිළිබඳ** මහාචාර්ය**,** ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**/අධ්‍යක්ෂ, ජාත්‍යන්තර සබඳතා අංශය (**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ **සෙනෙට් සභාව විසින් නම් කරන ලද)** |
| *9.2. (ඈ) අධ්‍යයන මණ්ඩල විසින් සිය සාමාජිකයින් අතුරින් පත්කරගන්නා ලද සාමාජිකයින් දෙදෙනෙකු* | | |
| 10 | ආචාර්ය **එච්.වී.එම්.රත්වත්තේ** | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**/භාෂා අධ්‍යයනාංශය/**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය **- අධ්‍යයන මණ්ඩලය/ දෙවන බස ලෙස භාෂාව ඉගැන්වීම** |
| 11 | ආචාර්ය **එස්.එම්. හේරත්** | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාද් **උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය**<br>**සාමාජික -** අධ්‍යයන **මණ්ඩලය/දෙවන බස ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම** |
| *9.2. (ඉ) තාක්ෂණික, අධ්‍යාපනික හෝ පරිපාලනමය ක්ෂේත්‍ර වෙනුවෙන් විශිෂ්ට දායකත්වයක් ලබා දෙන ලද පුද්ගලයින් අතුරින් කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින් දෙදෙනෙකු* | | |
| 12 | මහාචාර්ය **ඩබ්ලිව්. අයි. සිරිවීර** | **සම්මානිත** මහාචාර්ය**, පේරාදෙණිය විශ්වවිද්‍යාලය** |
| 13 | මහාචාර්ය **එල්.ආර්. ජයසේකර** | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය**, උද්භිද විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද)** |
| *9.2.(ඊ) ගුරු අධ්‍යාපනය නියෝජනය වෙනුවෙන් ජාතික අධ්‍යාපන ආයතනය විසින් නම් කරනු ලබන අයෙකු* | | |

| | | |
|---|---|---|
| **14** | **වී.ඩී.සී.පී. පෙරේරා මහත්මිය** | **අධ්‍යක්ෂ/බාහිර සම්පත් කළමනාකරණ ඒකකය සහ අධ්‍යක්ෂ, ඉංග්‍රීසි (රාජකාරි ආවරණය කරනු ලබන), ජාතික අධ්‍යාපන ආයතනය** |
| **15** | **එම්.එෆ්.එස්.පී.** ජයවර්ධන **මහතා** | **නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, විද්‍යාව හා තාක්ෂණවේදය, ජාතික අධ්‍යාපන ආයතනය** |
| *මහා භාණ්ඩාගාරයේ නියෝජිත* | | |
| **16** | ආචාර්ය **එම්.කේ.සී. සේනානායක** | **අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාතර්මේන්තුව, මහා භාණ්ඩාගාරය** |

**(ii) <u>දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි බස ඉගැන්වීම සඳහා වන පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයින්</u>**

| | නම | තනතුරු නාමය |
|---|---|---|
| **1** | ආචාර්ය **එච්. එස්. රඹුක්වැල්ල** | **සභාපති, අධ්‍යක්ෂ**/පශ්චාද් උපාධි **ඉංග්‍රීසි භාෂා** ආයතනය |
| *12. (1) (අ) සභාපති වශයෙන් අධ්‍යක්ෂතුමා;* | | |
| **2** | ආචාර්ය **ඩබ්ලිව්. සෙනෙවිරත්න** | **පුස්තකාලයාධිපති/**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| **3** | **ආර්. අමරසේකර මහත්මිය** | වැඩ බලන **පුස්තකාලයාධිපති/**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| *12. (1) (ආ) තොරතුරු තාක්ෂණවේදයට අදාල පුස්තකාල හා වෙනත් මාධ්‍ය සම්පත් ඇතුලත් වන, ආයතනයේ ඉගෙනුම් සම්පත් භාර කරු;* | | |
| **4** | **එච්.ඩී. විජේසේකර මහත්මිය** | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාද් **උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය** |
| **5** | **එම්.අයි. ජැන්ස් මහත්මිය** | කථිකාචාර්ය/පශ්චාද් **උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය** |
| **6** | ආචාර්ය **එස්.එම්. හේරත්** | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාද් **උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය** |
| *12. (1) (ඇ) අදාල මණ්ඩලයට හෝ ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන අධ්‍යයන මණ්ඩලවලට අදාල වන පරිදි ආයතනයේ ස්ථිර ගුරු භවතුන් ;* | | |
| **7** | **එස්.ඒ.එස්.කේ. පෙරේරා මහත්මිය** | **ශිෂ්‍ය නියෝජිත** |
| **8** | **ඕ.එච්. රත්නසිරි මහත්මිය** | **ශිෂ්‍ය නියෝජිත** |
| **9** | **එස්.එම්. නියංගොඩ මහත්මිය** | **ශිෂ්‍ය නියෝජිත** |
| *12. (1) (ඈ) ආයතනයේ ශිෂ්‍යයින් විසින් පත්කරගනු ලබන ශිෂ්‍යයින් දෙදෙනෙකු;* | | |
| **10** | **එල්.කේ. කුමාරණතුංග මහත්මිය** | **බාහිර** කථිකාචාර්ය/**දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, විවෘත විශ්වවිද්‍යාලය (සාමාජික)** |
| **11** | **පී. නාගසුන්දරම් මහත්මිය** | **බාහිර** කථිකාචාර්ය/**දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, විවෘත විශ්වවිද්‍යාලය (සාමාජික)** |
| **12** | ආචාර්ය **ආර්. රසූල්** | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, **ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය** |
| *12. (1) (ඉ) ආයතන කාර්යමණ්ඩල සාමාජිකයින් නොවන, ආයතනයට අදාල අධ්‍යයන ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වය ප්‍රකට කළ පුද්ගලයින් අතුරින් අදාල අධ්‍යයන මණ්ඩල විසින් පත් කරගනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු;* | | |
| **11** | ආචාර්ය **ඩී. දේවේන්ද්‍ර** | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**භාෂා අධ්‍යයනාංශය/, විවෘත විශ්වවිද්‍යාලය** |
| **12** | **එස්.ආර්. ඉලංගකෝන් මහත්මිය** | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, **ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය, කොළඹ විශ්වවිද්‍යාලය** |
| **13** | ආචාර්ය **කේ.ආර්.එම්. ද සිල්වා** | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/**භාෂා අධ්‍යයනාංශය,** ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| *12. (1) (ඊ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, මණ්ඩලයේ විෂය පථය යටතට ගැනෙන විෂයයන් උගන්වනු ලබන පුද්ගලයින් තිදෙනෙකු;* | | |

**(iii)**<u>**දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයින්**</u>

| | නම | තනතුරු නාමය |
|---|---|---|
| **1** | ආචාර්ය **එච්.එස්. රඹුක්වැල්ල** | **සභාපති, අධ්‍යක්ෂ/**පශ්චාද් **උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය** |
| *12. (1) (අ) සභාපති වශයෙන් අධ්‍යක්ෂතුමා ;* | | |
| **2** | ආචාර්ය **ඩබ්. සෙනෙවිරත්න** | **පුස්තකාලයාධිපති/**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| **3** | **ආර්. අමරසේකර මහත්මිය** | **වැඩ බලන පුස්තකාලයාධිපති/**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| *12. (1) (ආ) තොරතුරුතාක්ෂණවේදයටඅදාල පුස්තකාල හා වෙනත් මාධ්‍ය සම්පත් ඇතුලත් වන, ආයතනයේ ඉගෙනුම් සම්පත් භාර කරු ;* | | |
| **4** | **එච්.ඩී. විජේසේකර මහත්මිය** | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/**පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය** |
| **5** | **එම්.අයි. ජැන්ස් මහත්මිය** | කථිකාචාර්ය/**පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය** |
| **6** | ආචාර්ය **එස්.එම්. හේරත්** | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/**පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය** |
| *12. (1) (ඇ) අදාල මණ්ඩලයට හෝ ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන අධ්‍යයන මණ්ඩලවලට අදාල වන පරිදි ආයතනයේ ස්ථිර ගුරු භවතුන් ;* | | |
| **7** | **ඩබ්ලිව්.එම්.ජී.යූ. විජේසුන්දර මහත්මිය** | **ශිෂ්‍ය නියෝජිත/**පශ්චාද් **උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය** |
| **8** | **එල්.එම්.එස්. විජේතුංග මහත්මිය** | **ශිෂ්‍ය නියෝජිත/**පශ්චාද් **උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය** |
| *12. (1) (ඈ) ආයතනයේ ශිෂ්‍යයින් විසින් පත්කරගනු ලබන ශිෂ්‍යයින් දෙදෙනෙකු ;* | | |
| **9** | ආචාර්ය **ඩී. දේවේන්ද්‍ර** | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/**භාෂා අධ්‍යයනාංශය,** ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| **10** | ආචාර්ය **එච්.වී.එම්. රත්වත්තේ** | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/**භාෂා අධ්‍යයනාංශය,** ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| *12. (1) (ඉ) ආයතන කාර්යමණ්ඩල සාමාජිකයින් නොවන, ආයතනයට අදාල අධ්‍යයන ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වය ප්‍රකට කළ පුද්ගලයින් අතුරින් අදාල අධ්‍යයන මණ්ඩල විසින් පත් කරගනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු;* | | |
| **11** | **මහාචායර් මෛත්‍රී වික්‍රමසිංහ** | **ඉංග්‍රීසි භාෂාව පිළිබඳ** මහාචාර්ය/**ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය** |
| **12** | ආචාර්ය **වී.වී. මැදවත්තේගෙදර** | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය **/භාෂා අධ්‍යයනාංශය,** ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| **13** | ආචාර්ය **ජේ. කෙනඩි** | **ප්‍රධානි/ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය** |
| *12. (1) (ඊ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, මණ්ඩලයේ විෂය පථය යටතට ගැනෙන විෂයයන් උගන්වනු ලබන පුද්ගලයින් තිදෙනෙකු;* | | |
| **14** | ආචාර්ය **ලක්ෂ්මි ද සිල්වා** | **හිටපු** ජ්‍යෙෂ්ඨ **කථිකාචාර්ය, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය** |

| | | |
|---|---|---|
| **15** | ආචාර්ය **එස්. විජේවර්ධන** | ජ්‍යෙෂ්ඨ **කථිකාචාර්ය, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය** |
| **16** | ආචාර්ය **කේ. වර්ණපාල** | ජ්‍යෙෂ්ඨ **කථිකාචාර්ය /ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය** |
| *12. (1) (උ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, ඉහත සඳහන් වර්ගීකරණය යටතට නොගැනෙන ගුරුවරුන් දෙදෙනෙකු ;* | | |

**(iv)** <u>පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩල සාමාජිකයින්</u>

**ස්ථිර කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ නම්**

| | නම | තනතුරු නාමය |
|---|---|---|
| 1 | ආචාර්ය එච්.එස්. රඹුක්වැල්ල<br>දර්ශනපති (හොංකොං) | අධ්‍යක්ෂ |
| 2 | එච්.ඩී. විජේසේකර මහත්මිය<br>දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති (පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය/ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය) | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
| 3 | ආචාර්ය එස්.එම්.හේරත් මහත්මිය<br>දර්ශනපති (ටොරොන්ටෝ, කැනඩාව) | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
| 4 | එම්.අයි. ජැන්ස් මහත්මිය<br>දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති (පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය/ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය) | කථිකාචාර්ය (පරිවාස) |
| 5 | ඩබ්ලිව්.ඩී.ටී. තිලකරත්න මහතා<br>විද්‍යාවේදී (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී |
| 6 | එස්.එම්.පී.ඒ. සුභානි මහත්මිය<br>ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (ජයවර්ධනපුර) | සහකාර මූල්‍යාධිකාරී |
| 7 | ජී.පී.අයි.ඩී. සිරිවර්ධන මහත්මිය | පරිගණක යෙදවුම් සහකාර |
| 8 | එච්.එන්.එන්. පෙරේරා මහතා | පරිගණක යෙදවුම් සහකාර |
| 9 | ඩී.එම්.ටී.පී. දිසානායක මහත්මිය<br>ශාස්ත්‍රවේදී (පේරාදෙණිය) | පරිගණක යෙදවුම් සහකාර |
| 10 | ඒ.ආර්.එස්.කේ. රාජපක්ෂ මහත්මිය | පොත් තබන්නිය |
| 11 | ඒ.ජී.ආර්.එම්.ඩී.කේ. රණවීර මහත්මිය | කළමනාකරණ සහකාර |
| 12 | ඩබ්ලිව්.එම්.ඩී.ආර්.බී. වීරසිංහ මහතා | කම්කරු |
| 13 | ආර්.යූ. ජයසිංහ මහතා | වැඩ සහායක |

## 2. අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය

### (අ) කෙටි හැඳින්වීම

2017 වර්ෂය ආයතනයේ සාරානුරකුල වර්ධනය සඳහා වූ වර්ෂයක් විය. ආයතනයේ මානව සම්පත් ධාරිතාව ඉහළ නංවමින්, ඉහළ පෙලේ සුදුසුකම්ලත්, අත්දැකීම් සහිත අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයෙකු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු වශයෙන් බඳවා ගැනීමට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකි විය. ඊට අතිරේකව, ආයතනයේ අනධ්‍යයන කාර්යමණ්ඩලය වැඩිදුරටත් ශක්තිමත් කරනු වස්, වැඩ සහායකවරයෙකු බඳවා ගැනීමට ද පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකි විය. 2018 වර්ෂයේ දී මුල් කාලීනව කළමනාකරණ සහායකවරයෙකු ද බඳවා ගැනීමට ද අපේක්ෂිතය. 2017 වර්ෂයේ දී සිදු කරන ලද විශ්වවිද්‍යාලයීය පුළුල් කාර්යමණ්ඩල සමාලෝචනයේ කොටසක් වශයෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි ආයතනය වෙත මෙම තනතුරු ඇති කෙරිණි.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා වෙන් වූ ගොඩනැඟිල්ලක් පවත්වාගෙනයාම තුළින් ආයතනයේ පැවැත්ම මෙන්ම සිය සේවාදායකයින් වෙනුවෙන් උසස් මට්ටමේ සේවාවන් සැපයීමට තමා සතු හැකියාවද පැහැදිලි ලෙසම ශක්තිමත් කරන ලදී. 2017 වර්ෂයේදී, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් මාර්තු හා ඔක්තෝබර් යන මාස දෙකෙහිදීම සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර උදෙසා අධ්‍යයන ලිවීම් සහ පර්යේෂණ ක්‍රම යන මැයෙන් සාර්ථක කෙටි පාඨමාලාවක් දායාද කරන ලදී. ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයන් සහ පර්යේෂණ ලිවීම් සහ ඉදිරිපත් කිරීමේ කුසලතා ආවරණය කරන ලද මෙම පැය 30 සවිස්තරාත්මක පාඨමාලාව වෙත මහ බැංකුව, නීතිපති දෙපාර්තමේන්තුව, විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලය හා රාජ්‍ය නොවන සංවිධානවල මෙන් ම වෙනත් පර්යේෂණ සංවිධානවල කාර්යමණ්ඩලය වැනි පුළුල් ක්ෂේත්‍රයක විහිදුණු ශිෂ්‍යයෝ ඇදී ආහ. මෙම පාඨමාලාව පිළිබඳ වැඩිදුර තොරතුරු සහ ශිෂ්‍යයින් විසින් ලබා දෙන ලද ස්වයං විවේචන මෙම වාර්තාවේ පසුව දක්වා ඇත.

ඉහත කෙටි පාඨමාලාවට අමතරව, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් අ.පො.ස සා.පෙල සාහිත්‍යය පිළිබඳ පැය 22ක කෙටි පාඨමාලාවක් මෙන්ම අ.පො.ස උ.පෙල සාහිත්‍යය පිළිබඳ පැය 42ක තවත් කෙටි පාඨමාලාවක් ද පවත්වන ලදී. මෙම පාඨමාලා දෙක සඳහාම අතිශය ඉහළ ඉල්ලුමක් පැවැති අතර, ඒ සඳහා ධනාත්මක ප්‍රතිචාර ද හිමි විය. ගොඩනැඟිල්ල සතු වීම මඟින් ද, ආයතනයේ ආයතනික ප්‍රතිරූපය ඉහළ නැංවීම පිණිස දායක විය හැකි අයුරින් නව්‍යාත්මක අවස්ථාවන් ගණනාවක් සඳහා සිය දායකත්වය ලබා දීමට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකියාව ලැබිණි. 2016 වර්ෂය අවසන් කාලසීමාවේදී සහ 2017 වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ආයතනයේ ආයතනික ජාලය ගොඩනැංවීමට අතිශය වැදගත් ලෙස දායක වූ ජාත්‍යන්තර වැඩමුළු තුනක් පවත්වන ලද අතර, ශක්‍යතාවයෙන් යුතු අනාගත ජාත්‍යන්තර සාමූහිකත්ව හා හවුල්කාරිත්ව වෙනුවෙන් මාර්ග විවෘත කරන ලදී. ඊට අමතරව, ආරාධිත ජාත්‍යන්තර විද්වතුන් දෙදෙනෙකු විසින් වැඩමුළු පවත්වන ලද අතර, මහජන ඉදිරිපත්කිරීම් ද සිදු කරන ලදී. මෙම වසරේදී, ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නගරයේ පිහිටි සිටි විශ්වවිද්‍යාලයේ බරුච් කොලීජිය හා එක්ව අන්තර්ජාලය හරහා සිදු කරනු ලබන විෂය නිර්දේශ සාමූහිකත්වය මඟින් අන්තර්ජාතික සාමූහිකත්ව ස්ථාපිත කිරීමේ වැදගත් පියවර සනිටුහන් කරන ලදී.අන්‍යෝන්‍ය වශයෙන් ඉගෙනීමට හා එකිනෙකාගේ සංස්කෘතික හා දේශීය දැනුමින් ප්‍රතිලාභ ලැබිය හැකි වන පරිදි, ශිෂ්‍යයින් වෙත අවස්ථාව සැලසෙන ලෙස අන්තර්ජාලය මඟින් සිදු කරනු ලබන අසමමුහුතර්ක ඉගෙනුම් අවකාශයක් හරහා බරුච් කොලීජියේ ශිෂ්‍යයින් සමඟ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍යයින් විසින් සමූහයක් නිමර්ාණය කරන ලදී.

2017 වර්ෂය අවසන්භාගය තුල වෘත්තීයමය ඉංග්‍රීසි පුහුණුව පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව සහ ද්විභාෂික අධ්‍යාපනය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව යන නව වැඩසටහන් දෙක සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත අනුමැතිය ලබා දෙන ලදී. මෙම වැඩසටහන් දෙක සංවර්ධනය කිරීම ආරම්භ කරනු ලැබ ඇති අතර, එකී වැඩසටහන් දෙකම 2018 වර්ෂයේ දී ආරම්භ කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන් දෙක එක්කිරීම මඟින් ආයතනයෙහි ශිෂ්‍ය සංඛ්‍යාව සැලකිය යුතු අන්දමින්ඉහළ නැංවෙනු අතර, රට තුල ඉංග්‍රීසි අධ්‍යාපනය ඉහළ නැංවීම සම්බන්ධයෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මත ඇති කෙරෙනු ලබන බලපෑම වැඩිදුරටත් ගැඹුරු සහ පුළුල් කෙරෙනු ඇත. සුවිශේෂීව ද්විභාෂික අධ්‍යාපනය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව හරහා Content Language Integrated Learning (CLIL) ප්‍රවේශය උපයෝගි කරගනිමින්, විෂය හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම යන ද්විත්වයම ලබා දිය හැකි නව ගුරු පරපුරක් පුහුණු කිරීම මඟින් රට තුල ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මට්ටම ඉහළ නැංවීම සඳහා දායකත්වය ලබා දීමට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකි වනු ඇත.

2017 වර්ෂයේ දී, සම්මන්ත්‍රණ කාමරය සඳහා දේශන ශාලා පුටු, වායුසමීකරණ යන්ත්‍ර, ශබ්ද පරිපාලන පද්ධතියක් හා බහු මාධ්‍ය පහසුකම් ලබා දීම මඟින් සිය නව ගොඩනැඟිල්ල වැඩිදියුණු කිරීමට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකි විය. සම්මන්ත්‍රණ කාමරය තුල75 දෙනෙකු වෙනුවෙන් අවකාශ සැලසිය හැකි අතර, 2017 දෙසැම්බර් මස පවත්වන ලද පර්යේෂණ සමුළුව වැනි මහජන උත්සව සඳහා ද අනර්ඝ වේ. මීට අමතරව, ආසන්න වශයෙන් 35 දෙනෙකුට අවකාශය සැලසෙන පරිදි තවත් කුඩා කාමර දෙකක් වායුසමීකරණයක් සහ බහුමාධ්‍ය හා පහසුකම්වලින් සමන්විත වන අතර, කුඩා උත්සව අවස්ථාවන් සඳහා යොදාගත හැකි මෙන්ම ඉහත සඳහන් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පැවැත්වීමටද උපයෝගි කරගන්නා ලදී. එමෙන්ම, ආබාධිත අයවළුන් වෙනුවෙන් අවශ්‍ය ප්‍රමාණාත්මක අවකාශය සලසා දීම පිණිස, සෝපානයක් සවි කර, ස්ථාපිත කරන ලද අතර, ගොඩනැඟිල්ලේ සියලුම ප්‍රධාන යටිතල පහසුකම් අවශ්‍යතා සපුරාලමින් විදුලි ජනන යන්ත්‍රයක් සවි කර, ස්ථාපිත කරන ලදී.

2017 වර්ෂයේ දී සිට ඉදිරිය දෙස බැලීමේ දී, 2018 වර්ෂය තුල වැඩිදුර ප්‍රගතියක් මෙන්ම පුළුල් කිරීමක් ගෙන ඒමට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් අපේක්ෂා කරනු ලබයි. ආයතනය විසින් ලබා දෙනු ලබන පූර්ණකාලීන අධ්‍යයන වැඩසටහන් සංඛ්‍යාව මඟින් ශිෂ්‍ය සංඛ්‍යාව ද ඉහළ නැංවීමට ද අපේක්ෂිත අතර, කෙටිකාලීනපුහුණු වැඩසටහන්වල සංඛ්‍යාව හා ගුණාත්මකබව ද ඒ අයුරින්ම ඉහළ නැංවෙනු ඇත. ආයතනයේ පර්යේෂණ පැතිකඩ වැඩිදියුණු කිරීම පිණිස, බාහිර මූලාශ්‍ර වෙතින් පර්යේෂණ ප්‍රදාන අරමුදල් ලබා ගැනීමටද පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සැලසුම් කරනු ලැබ ඇත. ආයතනය විසින් සිය පැවැත්මෙහි වෙනස්වූ අදියරක් වෙත ප්‍රවේශ වන හෙයින්, ඒ සඳහා නව අභියෝගාත්මක මාවතක් හෙළිපෙහෙළි කරමින්, 2018 වර්ෂයේ දී නව උපායමාර්ගික සැලැස්මක් කෙටුම්පත් කරනු ලැබේ.

2018 වර්ෂයේ දී සිට ඉදිරියේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට පවත්නා අභියෝගයක් වනුයේ, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය තුල සිය ස්ථානය තවදුරටත් තහවුරු කරගැනීම සහ නව අවස්ථා හඳුනාගනිමින් හා නව අභියෝග හා තර්ජන අපේක්ෂිතව, ඒවා සාර්ථක ලෙස විසඳාගනිමින් වර්ධනය වීමට මංපෙත් සලසා ගැනීමයි.

ආචාර්ය එච්.එස්.රඹුක්වැල්ල
අධ්‍යක්ෂ/පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

**පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පවත්වනු ලබන වැඩසටහන් හා සම්පත් සහ ශිෂ්‍යයින්ගේ තොරතුරු**

**අ. පවත්වන ලද පශ්චාද් උපාධි පාඨමාලා සංඛ්‍යාව**

1. **දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය**
2. **දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය**

**ආ. පවත්වන ලද පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව**

1. **දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව**
2. **දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව**

**ශිෂ්‍යයින්**

| වැඩසටහන | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MA in TESL) | **66** |
| දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව/ශාස්ත්‍රපති උපාධිය(PG Dip./MA in TESL) | **135** |
| **ශාස්ත්‍රපති උපාධිය (දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ)** | **58** |
| | **259** |

**සම්පත්**

| අධ්‍යයන කාර්යමණ්ඩලයේ මුළු සංඛ්‍යාව | අනධ්‍යයන කාර්යමණ්ඩලයේ මුළු සංඛ්‍යාව |
|---|---|
| **අධ්‍යක්ෂ**<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු **– 03***<br>කථිකාචාර්ය **– 01**<br>______________________<br>**(*-එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු 2015 පෙබරවාරි මස සිට අධ්‍යයන නිවාඩු ලබා ඇති අතර, එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා නිදහස් කරනු ලැබ ඇත.)** | **පරිපාලන කාර්යමණ්ඩලය - 02**<br><br>**පරිපාලනමය නොවන කාර්යමණ්ඩලය - 07** |
| **05** | **09** |

**(ආ) ජයග්‍රහණ**

**පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිය ගොඩනැඟිලි පහසුකම ද සහිතව, 2017** වර්ෂයේ දී පහත **සඳහන් මහජන උත්සව අවස්ථාවන් පවත්වන ලදී :**

**පර්යේෂණ සංසදය**

- **සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (**දෙවන බස පසුබිමක් තුළ**)**
  **2017**ජනවාරි මස **16**
- ® **දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය** (TESL)
  **2017** පෙබරවාරි මස **03**

**පර්යේෂණ සම්මන්ත්‍රණය**

**දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය** (TESL)**- 2017** දෙසැම්බර් මස **08 වන දින ප්‍රධාන අමුත්තා ලෙස මුලසුන හෙබවූ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, සුනිල් හෙට්ටිආරච්චි මහතා සමඟ.**




**ආරාධිත දේශනය**

"In Defense of EFL" **පිළිබඳව නිව්**යෝර්ක් හි **පිහිටි සිටි විශ්වවිද්‍යාලයේ බරුච් කොලීජියේ ආචාර්ය බෲක් ශ්‍රයිබර් විසින් සිදු කරන ලද මහජන දේශනයක්**






**පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිය දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා අගෝස්තු මාසයේ දී ශිෂ්‍යයින් 54 දෙනෙකු ලියාපදිංචි කරගන්නා ලදී. ප්‍රවේශය සඳහා ඉල්ලුම් කරන ලද 170 අතුරින් ප්‍රවේශ විභාගය සඳහා 134 දෙනෙකු මුහුණ දුන් අතර,**

**54 දෙනෙකු තෝරාගන්නා ලදී. මෙම කාණ්ඩය සමඟින්, මෙම වැඩසටහනේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 181 වේ. දෙසැම්බර් මාසයේ දී, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිය සාහිත්‍යය ඉගැන්වීම (දෙවන බස පසුබිමක් තුල) පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා ශිෂ්‍යයින් 23 දෙනෙකු ලියාපදිංචි කරගන්නා ලදී. අයදුම් කරන ලද ශිෂ්‍යයින් 64 දෙනෙකු අතුරින් 54 දෙනෙකු ප්‍රවේශ විභාගය සඳහා පෙනී සිටි අතර, මෙම වැඩසටහනේ ලියාපදිංචි මුළු සංඛ්‍යාව 58 දක්වා ගෙන යමින් ශිෂ්‍යයින් 23 දෙනෙකු ලියාපදිංචි කරගන්නා ලදී.**

**සැලකිය යුතු අයුරින් ඉල්ලුමක් පැවැති පැය 20 සිට පැය 40 දක්වා කාලසීමාවක් ඔස්සේ විහිද යන කෙටිකාලීන පාඨමාලා මාලාවක් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ලබා දෙන ලදී. විස්තර පහත දක්වා ඇත.**




*අ.පො.ස සාමාන්‍ය පෙල නව විෂය නිර්දේශය සඳහා ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීමෙහි ලා ගුරුවරුන්ගේ ශක්‍යතාව ඉහල නැංවීම පිළිබඳ කෙටි පාඨමාලාව සඳහා සහභාගි වූ ශිෂ්‍යයින්.*







*අ.පො.ස උසස් පෙල ඉංග්‍රීසි සාහිත්‍යය නව විෂය නිර්දේශය පිළිබඳ කෙටි පාඨමාලාව*

<u>2017 වර්ෂය තුල පවත්වන ලද කෙටි පාඨමාලා පිළිබඳ විස්තර</u>

| | පාඨමාලාවේ නම | කාලසීමාව | මාධ්‍යය | ශිෂ්‍යයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **1** | අ.පො.ස සාමාන්‍ය පෙල නව විෂය නිර්දේශය සඳහා ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීමෙහි ලා ගුරුවරුන්ගේ ශක්‍යතාව ඉහල නැංවීම පිළිබඳ කෙටි පාඨමාලාව | පැය 22 (පෙබරවාරි 22 – අප්‍රේල් 05) | ඉංග්‍රීසි | **40** |
| **2** | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍රයන්හි අධ්‍යයන ලිවීම් සහ පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටි පාඨමාලාව | පැය 32 (මාර්තු 06 – මැයි 24) | ඉංග්‍රීසි | **30** |
| **3** | බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අභ්‍යන්තර උපදේශකයින් හා සහකාර අධ්‍යක්ෂවරුන් සඳහා ධාරිතා සංවර්ධන සම්මන්ත්‍රණය | දින 03 (අප්‍රේල් 26 – 28) | ඉංග්‍රීසි | **49** |
| **4** | අ.පො.ස උසස් පෙල ඉංග්‍රීසි සාහිත්‍යය නව විෂය නිර්දේශය පිළිබඳ කෙටි පාඨමාලාව | පැය 45 සැප්තැම්බර් 11 - නොවැම්බර් 20 | ඉංග්‍රීසි | **26** |
| **5** | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍රයන්හි අධ්‍යයන ලිවීම් සහ පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටි පාඨමාලාව | පැය 32 (ඔක්තෝබර් – දෙසැම්බර්) | ඉංග්‍රීසි | **28** |

**මෙම කෙටි පාඨමාලා අතුරින්, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍රයන්හි අධ්‍යයන ලිවීම් සහ පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටි පාඨමාලාව නවෝත්පාදක පාඨමාලාවක් වූ අතර, ශාස්ත්‍රීය වශයෙන් සිදු කරනු ලබන ශාස්ත්‍රපති උපාධියේ සිට දර්ශනපති උපාධිය දක්වා විහිදෙන පශ්චාද් උපාධි සුදුසුකම් සඳහා ලියාපදිංචි වනු ලබන වෙනස් වූ ජීවන මාර්ගවල ඇවිද යන විශාල සිසුන් සංඛ්‍යාවකගේ වර්ධනය වන ඉල්ලුමට එමගින් විසඳුම් ලබා දේ. පහත දැක්වෙනුයේ එම පාඨමාලාව පිළිබඳ ශිෂ්‍යයින් කිහිපදෙනෙකුගේ සාක්ෂිමය ඉදිරිපත් කිරීමය.**

**පහත දැක්වෙනුයේ එම පාඨමාලාව පිළිබඳ ශිෂ්‍යයින් කිහිපදෙනෙකුගේ සාක්ෂිමය ඉදිරිපත් කිරීමය.**





"***අධ්‍යයන ලිවීම් හා පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටි පාඨමාලාව, පර්යේෂණ සිදු කිරීමට අපේක්ෂිත ශාස්ත්‍රාලිකයින්ගේ මෙන්ම වෘත්තීයවේදීන්ගේ ද මනස කලඹවනු ලබන වැඩසටහනක් ලෙස මම දුටුවෙමි. ශ්‍රී ලාංකේය පසුබිම තුල මෙම ක්ෂේත්‍රය පිළිබඳ විශේෂීකරණය වූ පාඨමාලාවල හිඟය ගැටලුවක් ලෙස පෙනේ. මෙවැනි ආකාරයේ විශේෂිත පාඨමාලාවක් ආරම්භ කිරීමේ ප්‍රමුඛයා ලෙස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් මෙම ගැටලුව විසඳාගැනීම සඳහා අනාගත පර්යේෂකයින් වෙත අගනා අවස්ථාවක් ලබා දෙනු ලැබේ. කථිකාචාර්යවරුන් දැනුම්වත්භාවයෙන් මෙන්ම සිය දැනුම විශිෂ්ට ලෙස සම්ප්‍රේෂණය කිරීමට ද සමත්ය. මා හට උපකාර අවැසි අවස්ථාවේදී, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සියලුම කාර්යමණ්ඩල සාමාජිකයින් ඉතා මිත්‍රශීලී මෙන්ම, පුද්ගලික වශයෙන් හමු විය හැකිය. පාඨමාලාවේ සංවිධානය හා ප්‍රදානය කිරීම පිළිබඳව මම ඉමහත් ලෙස සතුටු වෙමි. අනාගත පර්යේෂකයින් සඳහා මෙම පාඨමාලාව මම ඉතා ඉහලින් නිදෙර්ශ කරමි.***"

**ටී. උදයසීලන්**
**ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව**

"***අධ්‍යයන ලිවීම් හා පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටි පාඨමාලාව, ඕනෑම තාත්ත්වික පර්යේෂකයෙකු සඳහා පර්යේෂණ ක්‍රම පිළිබඳ ඉතා විශිෂ්ට ගණයේ හඳුන්වාදීමේ පාඨමාලාවකි. එමඟින් මානව ශාස්ත්‍රවේදී ශිෂ්‍යයෙකු සඳහා මිල කළ නොහැකි ආකාරයේ අන්තර්වර්යාත්මක හා ප්‍රායෝගික වශයෙන් ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක යන දෙආකාරයෙන්ම මග සලසා දෙනු ලබයි. මෙම පාඨමාලාව සතු විශිෂ්ට ඇඳුරු මඩුල්ල හා මනා ලෙස සකස් කරන ලද සංවිධාන ව්‍යුහය මඟින් මෙම පාඨමාලාව තීව්‍ර ලෙස ශක්තිමත් කරනු ලබන නමුත්, බොහෝ ප්‍රථම උපාධි මෙන්ම පශ්චාද් උපාධි පාඨමාලා මඟින් ලබා දෙනු නොලබන පර්යේෂණ ක්‍රම සඳහා මිල කළ නොහැකි හඳුන්වාදීමක් වේ. පශ්චාද් උපාධි පර්යේෂණ අධ්‍යයනය සඳහා දැඩි ලෙස ඇලුම් කරන ඕනෑම පර්යේෂකයෙකු වෙත මෙම පාඨමාලාව මම ඉතා ඉහලින් නිර්දේශ කරමි.***"

**දිනුෂිකා දිසානායක**
**විධායක අධ්‍යක්ෂ, නීතිය හා සමාජය භාරකාරිත්වය** (Law & Society Trust)

‘‘***අධ්‍යයන ලිවීම් හා පර්යේෂණ ක්‍රම - 2017 කෙටි පාඨමාලාව සාර්ථකව නිම කිරීම වෙනුවෙන් ස්තූතිය පළ කරමි. මෙම පාඨමාලාව වෘත්තීයමය වශයෙන් පවත්වන ලද අතර, සිය අදාළ ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වයට පත් අත්දැකීම් සහිත, හැකියාවෙන් යුත් කථිකාචාර්යවරුන්ගෙන් එය සමන්විත විය. අප වෙත ලබා දුන් පොත් මෙන්ම අත්පත්‍රිකා ද මිල කළ නොහැකි වන අතර, මෙම වැඩසටහන මනා ලෙස සම්බන්ධීකරණය කරන ලදී. වෙහෙසකර දවසක අවසානයේ මෙම***

*පාඨමාලාව ආරම්භ කිරීමට ප්‍රථම, ශිෂ්‍යයින් වෙත තේ කෝප්පයක් සහ කෙටි ආහාරයක් ලබා දීම අතිශයින්ම ඥානාන්විත විය. අත්පත්‍රිකා සම්බන්ධයෙන් ප්‍රායෝගික ක්‍රියාකාරකම් වෙනුවෙන් තවත් අමතර විනාඩි 15 – 20 ත් අතර කාලයක් තිබුණේ නම්, එය මහත් උපකාරී විය හැකිව තිබුණි. මම එය හදාරා, ඉතා හොඳින් ඉගෙනීම පිළිබඳව සතුටු වෙමි.*"

දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ
නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්,නීතිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

කෙටි පාඨමාලාවට අමතරව, 2017 වර්ෂයේ දී පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සවයේ දී ශාස්ත්‍රපති ශිෂ්‍යයින් 10 දෙනෙකු සහ පශ්චාද් උපාධි ඩිප්ලෝමා ශිෂ්‍යයින් 05දනෙකු විසින් සිය උපාධි ලබා ගැනීම හේතුකොට ගෙන, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ සිය ශාස්ත්‍රපති උපාධිය සම්බන්ධයෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සන්ධිස්ථානයකට එළඹිණි.

ආයතනය සඳහා මෙම විද්‍යාර්ථීන් සංඛ්‍යාව ඓතිහාසික වන අතර, පසුගිය වර්ෂ කිහිපය පුරා ඉගැන්වීමේ සහ ඉගෙනුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම පිණිස යොදාගන්නා ලද පද්ධති හා ක්‍රියාවලි ක්‍රියාත්මකභාවයේ පවතින බව පෙන්නුම් කෙරේ. 2017 වර්ෂයේ දී තවත් ශිෂ්‍යයින් 09 දෙනෙකු සිය ශාස්ත්‍රපති උපාධි සම්පූර්ණ කරන ලද අතර, තවත් 04 දෙනෙකු විසින් පශ්චාද් උපාධි ඩිප්ලෝමා ලබා ගන්නා ලදී. ශිෂ්‍ය ප්‍රතිපෝෂක වාර්තා ලබාගැනීමේ කොටසක් ලෙස, සිය වෘත්තීය දිවිය උදෙසා දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය දායක වූ ආකාරය සම්බන්ධයෙන් පැහැදිලි කරන ලෙස පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ආදි ශිෂ්‍යයින් කිහිපදෙනෙකුගෙන් ඉල්ලා සිටින ලදී. පහත දැක්වෙනුයේ 2016 වර්ෂයේ දී උපාධිය ලබා ගත් ශිෂ්‍යයින් විසින් ලබා දෙන ලද සාක්ෂිමය ඉදිරිපත්කිරීම් ත්‍රිත්වයකි.

සාක්ෂිමය ඉදිරිපත් කිරීම් - දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ 2016 වර්ෂයේ දී උපාධිධාරීන්

*"පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය මඟින් සිව් කුසලතා ඉගැන්වීම, පරීක්ෂණ හා ඇගයීම, විෂය මාලාව හා ද්‍රව්‍යාත්මක සැලසුම්, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ පවත්නා ගැටළු සහ සංවර්ධනය කිරීම් යනාදී ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමෙහි ලා වැදගත් වන සියලුම අංගයන් ආවරණය කෙරේ. මෙම පාඨමාලාව හරහා ඉගැන්වීම් - ඉගෙනුම් ක්‍රියාවලිය දෙස ඉගෙනුම ලබන අයෙකුගේ මානයෙන් බැලීමට හුරු කරවන ලද අතර, ඵලදායී ඉගැන්වීමේ රහස එය බව මම සිතමි.*

*ව්‍යවහාරික හා මනෝවිද්‍යාත්මක වාග්විද්‍යා පාඨමාලා හරහා විද්‍යාත්මක ප්‍රවේශයකින් යුතුව ඉගැන්වීමෙහි නියුතු භාෂා ගුරුවරයෙකු බවට මා පත් කරන ලදී. ඉගෙනුම්කරුවාගේ මනස තුල ඉගෙනුම් ක්‍රියාවලිය තැන්පත් වන බව ගුරුවරයා දන්නා විට, සෑම දිනකම වඩා යහපත් ඉගැන්වීමකට යොමු කරනු ලබන රසවත් අත්දැකීමක් බවට සෑම පාඩමක්ම පත් වේ. පසුගිය ප්‍රශ්නපත්‍රවල අන්තගර්ත පරීක්ෂණ වෙනස් කිරීම වෙනුවට මුල් ආකාරයේ පරීක්ෂණ සැලසුම් කිරීමේ හැකියාව මම ලබා ගත්තෙමි. සමාජ වාග්විද්‍යා පාඨමාලාව මඟින් එකම භාෂාව සමාජයේ විවිධ ස්ථරවලදී, කලාපවලදී හා පසුබිම් තුලදී භාවිත කරනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳ මගේ දැනුම පුළුල් කෙරිණි. සත්‍ය ජීවන පසුබිමක් තුල භාෂාව හැසිරෙන්නේ කෙසේද යන්න පිළිබඳ ඉගෙනුම ලබන්නාගේ අවබෝධය ඉහල නැංවීම ඕනෑම ගුරුවරයෙකු හට වැදගත් වේ. එක් එක් පාඨමාලාව පිළිබඳ ඇගයීම් මඟින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ක්ෂේත්‍රයෙහි නව ප්‍රවණතා සොයා යාමට මා*

*හට අවස්ථාව ලබා දුන් අතර, එය මා තුල ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පර්යේෂණ මත සදාකාලික ඇල්මක් ජනිත කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, ලොව පුරා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඉගෙනුම් ආධාරක සැලසුම් කිරීමේදී සුසමාදශරීත මාරුකිරීමක් සේ සැලකෙන, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පාඩම් පොත්වලට ගෝලීය වෙනස්කම් අන්තගර්ත කිරීම පිළිබඳ මගේ පර්යේෂණ අධ්‍යයනය පදනම් කරගැනීමට මම තීරණය කළෙමි. මෙම අධ්‍යයන පාඨමාලාව හරහා මම මහත් සේ මාගේ ඉගැන්වීම් කුසලතා වර්ධනය කර ගත් අතර, මාගෙන් ඉගෙනුම ලබන අයගේ අවශ්‍යතාවලට සරිලන ලෙස පාඩම් පොතක ඕනෑම පාඩමක් අදාල කරගැනීමට මට හැකියාව ඇත. ශ්‍රී ලංකාව තුල පරිපූර්ණ ඉංග්‍රීසි භාෂා ගුරුවරයෙකු බවට පත්වීමට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත කෘතඥ වෙමි.''*

සුධර්මා ගමගේ
**ඉංග්‍රීසි භාෂා සම්බන්ධීකාරක, රිච්මන්ඩ් විද්‍යාලය, ගාල්ල**

*''ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පවත්වනු ලබන දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන සිය යාවත්කාලීන කළ විෂයමාලාවන් හරහා දෙවන බස ඉගැන්වීමේ නවතම ප්‍රවණතා හා වැඩිදියුණුකිරීම්වලට මා අවතීර්ණ කරන ලදී. එමඟින් ඵලදායී ඉගැන්වීම, විෂයමාලාවන් සංවර්ධනය කිරීම, පරීක්ෂණ ආධාරක සකස් කිරීම, පන්ති කාමරය තුල තාක්ෂණවේදය යොදා ගැනීම සහ විශ්වාසදායී ලෙස ඉංග්‍රීසි දෙවන බස ලෙස භාවිත කරන්නියක් බවට පත්කරමින් ගැඹුරු පුහුණුවක නිරත කරවීම සඳහා අවශ්‍ය ශක්තිමත් න්‍යායාත්මක පදනමක් මෙන්ම විශ්ලේෂණාත්මක කුසලතා ද ලබා දෙන ලදී. ඇගයීම සඳහා උපයෝගී කරගන්නා ලද පරීක්ෂණ ක්‍රමවේදවල විවිධත්වය, ශාස්ත්‍රාලිකයෙකු වශයෙන් විශිෂ්ටත්වයට පත්වීමට මා හට අවශ්‍ය වූ ඉගෙනුම් කුසලතා රැසක් වැඩිදියුණු කරන ලදී. වැඩසටහන පුරාවට ප්‍රවේශ විය හැකි වූ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ විශිෂ්ට පෙළේ ශාස්ත්‍රීය කණ්ඩායමෙන් මාගේ පර්යේෂණ අධ්‍යයනය සඳහා ලද සුවිශේෂී අධීක්ෂණය හා අඛණ්ඩ මාර්ගෝපදේශනය නිසි වේලාවට මා හට උපාධිය සම්පූර්ණ කිරීමට අවකාශය සලසන ලදී.''*

**කේතකී නාගහවත්ත**
**ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය**
**කොළඹ විශ්වවිද්‍යාලය**

*''ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පවත්වනු ලබන දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් ක්ෂේත්‍රයේ නියුතු ඕනෑම අයෙකුගේ වෘත්තීයමය හා ශාස්ත්‍රීය සංවර්ධනය සඳහා වන අනගි පාඨමාලාවකි. මෙම පාඨමාලාව මනා ලෙස සංවිධානිත, යාවත්කාලීන කරන ලද පාඨමාලාවක් වන අතර, ඉහල වෘත්තීය මට්ටම්වල පවත්වාගෙන යනු ලබයි. සිය ක්ෂේත්‍රයන්හි ප්‍රමුඛ පෙළේ විද්වතුන් විසින් පවත්වනු ලබන දේශන අන්තර්ක්‍රියාත්මක මෙන්ම රසවත් වූ අතර, ඊට සහභාගී වීම වරප්‍රසාදයක් බඳු විය.*

*මම පෞද්ගලිකව මෙම පාඨමාලාව මඟින් ඉමහත් සේ ප්‍රතිලාභ ලබා ගතිමි. ඉගැන්වීම සඳහා වූ මාගේ ප්‍රවේශයෙහි සියලුම අංග කෙරෙහි එමඟින් ධනාත්මක බලපෑමක් ඇති කරන ලදී. මාගේ සේවා ස්ථානයේදී මගේ අදහස් හුවමාරු කරගැනීමටද, විෂයමාලාවේ සංශෝධන සිදු කිරීමේදී වැදගත් භූමිකාවක් ඉටු කිරීමටද එමඟින් මා වෙත දැනුම හා විශ්වාසය ලබා දෙන ලදී. පර්යේෂණ ක්‍රමවේදය සහ අධ්‍යයන ලිවීම් යන අංග මිල කළ නොහැකි වූයේ, එමඟින් මෙම ක්ෂේත්‍රයන්හි මූලික අඩිතාලමක්*

*ලබා දුන් හෙයිනි. ඊට අතිරේකව, ගුරුවරියක හා පරීක්ෂකවරියක ලෙස බ්‍රිතාන්‍ය කවුන්සිලයට සම්බන්ධ වීම මඟින් මාගේ වෘත්තීයමය ප්‍රගතිය වැඩිදියුණුකරගැනීමේදී මෙම පාඨමාලාව මූලික සුදුසුකමක් විය. මාගේ පෞද්ගලික සහ වෘත්තීයමය ප්‍රගතිය වෙනුවෙන් ආධාර වූ නිසා පමණක් නොව, තව තවත් ඉදිරියට යාමට මා උනන්දු කරවන ලද හෙයින් ද, මා විසින් සිදු කරන ලද හොඳම දේවල් අතුරින් මෙම පාඨමාලාව එකකි. මෙම පාඨමාලාව ඉහළින් නිර්දේශ කිරීමට කැමැත්තෙමි.''*

**ෆාතිමා ඉසදීන්**
**ගුරු වෘත්තික, බ්‍රිතාන්‍ය කවුන්සිලය**

**පශ්වාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා සහ කෙටි පාඨමාලාවට අමතරව, වැඩමුළු හා මහජන දේශන වැනි වෙනත් අවස්ථාවන් ගණනාවක් සඳහා ආයතනය විසින් සත්කාරකත්වය දරන ලදී. මෙම අවස්ථාවන්හි විස්තර පහත දක්වා ඇත.**

2017 වර්ෂයේ දී පවත්වන ලද වැඩමුළුවල විස්තර

| | පාඨමාලාවේ නම | කාලසීමාව | මාධ්‍යය | ශිෂ්‍යයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ශ්‍රී ලාංකේය සමාජ විද්‍යාවන්, දේශපාලනයේ සහ කලාවන්හි 'ග්‍රාමීය' පරිකල්පනය පිළිබඳ පර්යේෂණ වැඩමුළුව | දින 02 (ජූලි 14 –ජූලි 15) | ඉංග්‍රීසි | 30 |
| 2 | ලාංකේය අධ්‍යයනය සඳහා වන ඇමෙරිකානු ආයතනය විසින් අනුග්‍රාහකත්වය ලබා දෙන භාෂා ඇගයීම් වැඩමුළුව | පැය 22 (ජූලි 25) | ඉංග්‍රීසි | 30 |
| 3 | ලිවීම් උපදේශකවරුන් සඳහා පීඨමය සංවර්ධන වැඩමුළුව | පැය 02 (අගෝස්තු 04) | ඉංග්‍රීසි | 17 |

2017 වර්ෂයේ දී පවත්වන ලද ආරාධිත දේශන/වෙනත් ක්‍රියාකාරකම්හි විස්තර

| | පාඨමාලාවේ නම | මාධ්‍යය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | "In Defense of EFL" : ආචාර්ය බෲක් ශ්‍රයිබර් විසින් සිදු කරන ලද මහජන දේශනය | ඉංග්‍රීසි | 19 |
| 2 | පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පර්යේෂණ සංසදය - 08/12/2017 | ඉංග්‍රීසි | 35 |

| වැඩමුළුවේ තේමාව | කාලසීමාව | මාධ්‍යය | ශිෂ්‍යයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| ශ්‍රී ලාංකේය සමාජ විද්‍යාවන්, දේශපාලනයේ සහ කලාවන්හි 'ග්‍රාමීය'පරිකල්පනය පිළිබඳ පර්යේෂණ වැඩමුළුව | දින 02 (ජූලි 14 –ජූලි 15) | ඉංග්‍රීසි | 30 |
| ලාංකේය අධ්‍යයනය සඳහා වන ඇමෙරිකානු ආයතනය විසින් අනුග්‍රාහකත්වය ලබා දෙන භාෂා ඇගයීම් වැඩමුළුව | පැය 22 (ජූලි 25) | ඉංග්‍රීසි | 30 |
| ලිවීම් උපදේශකවරුන් සඳහා පීඨමය සංවර්ධන වැඩමුළුව | පැය 02 (අගෝස්තු 04) | ඉංග්‍රීසි | 17 |

**පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් 2016 වසරේ දී උපයන ලද ආදායම වූයේ රු.7,605,444/- කි. 2017 වර්ෂය වන විට, එය රු. 54,247,485/- කින් ඉහල නැංවිණි.**

(ඇ) අභියෝග

සිය ආයතනික ඉතිහාසය තුල ප්‍රගතිය අකර්මණ්‍ය කරන ලද ප්‍රධාන අභියෝගවලින් එකක් වූ සිය වැඩසටහන් පවත්වාගෙන යාම පිණිස, ඒ සඳහා වෙන් වූ ගොඩනැඟිල්ලක් හා ඉගැන්වීම් සහ ඉගෙනුම් අවකාශය නොමැති වීම සාර්ථක ලෙස විසඳාගැනීමට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකිව ඇත. 2016 වර්ෂයේ දී, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිය නවතම සිව්මහල් ගොඩනැඟිල්ල භාවිතයට ගන්නා ලද අතර, 2017 වර්ෂයේ දී ගෘහභාණ්ඩ, සෝපානය හා විදුලි ජනන යන්ත්‍රය යනාදී සියලුම ප්‍රධාන ගොඩනැඟිලි අවශ්‍යතා මිලදී ගෙන, ස්ථාපිත කරන ලදී.

කෙසේ වුවද, ආරාධිත කාර්යමණ්ඩලය මත පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඉහළ රඳා පැවැත්ම මූලික සාධකයක් ලෙස පවතී. මෙය රටේ සියලුම පශ්චාද් උපාධි ආයතනවල ලක්ෂණයක් බවට පත් වෙමින් පැවතියදී, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සම්බන්ධයෙන්, මෙය විශේෂිත කරුණක් බවට පත් වනුයේ, විවෘත විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, වෙනත් ජාතික විශ්වවිද්‍යාල හා සැසඳීමේ දී සාපේක්ෂව කුඩා වන හෙයින් සහ එම හේතුව නිසාම, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට කොළඹ හා ඒ අවට පිහිටි වෙනත් ජාතික විශ්වවිද්‍යාල මත රඳා පැවතීමට සිදු වන හෙයිනි.ඇතැම් අවස්ථාවන්හි දී, ආරාධිත කාර්යමණ්ඩලය ලබා ගත හැකි අවකාශය සීමිත වේ. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් 2017 වර්ෂයේ දී අතිරේක අධ්‍යයන කාර්යමණ්ඩල තනතුරු දෙකක් සඳහා ඉල්ලීමක් සිදු කරනු ලැබුවද, භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් එක් ඉල්ලීමක් පමණක් අනුමත කරන ලදී.ආයතනය සතු ලබා ගත හැකි මානව සම්පත්වල සංඛ්‍යාව හා ගුණාත්මක බව හා එහි ශිෂ්‍යයින්ගේ ප්‍රගතියේ පවත්නා ගුණාත්මක බව අතර ඍජු අන්තර් සබඳතාවක් පවතින හෙයින්, වැඩිදුර කාර්යමණ්ඩලීය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීම අඛණ්ඩව සිදු කරගෙන යාමට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සැලසුම් කරනු ලැබේ.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් මුහුණ දිය යුතු තවත් අභියෝගයක් වනුයේ, සිය සන්නාමය හා දෘශ්‍යභාවය වැඩිදියුණු කිරීමයි. මේ වන විට යම්තාක් දුරකට සීමිත පිරිසක් අතර පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය පිළිබඳ දැනුම්වත් වී ඇති අතර, එහි පැවැත්ම පුළුල් පිරිසක් වෙත ප්‍රසාරණය කිරීමට අවශ්‍ය වේ. මෙම පුළුල් දෘශ්‍යභාවය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ආයතනික වර්ධනය සඳහා ඉතා වැදගත් වේ. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සැලකිලිමත් විය යුතු තවත් එක් ක්ෂේත්‍රයක් වනුයේ, රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ යන දෙඅංශයේම ඉංග්‍රීසි භාෂාව ආශ්‍රිත පශ්චාද් උපාධි වැඩසටහන්වල පවත්නා ඉහළ තරඟකාරීත්වය යි.රටේ ඉංග්‍රීසි භාෂා අධ්‍යයනය සඳහා වන ප්‍රමුඛ පෙළේ පශ්චාද් උපාධි ආයතනයක් ලෙස පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඉතිහාසය සලකා බැලීමේ දී, ඒ සතුව ශක්තිමත් ස්ථානයක් පවතී. එසේ වුවද, මෙම තත්ත්වය පවත්වාගෙන යාම යන්නෙන් නිර්මාණාත්මක චින්තනය සහ ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාද් උපාධි අධ්‍යාපනය තුල නැඟී එන වෙනස්කම්වලට නම්‍යශීලී වීම අදහස් කෙරේ.

**(ඇ) ඉදිරි සැලසුම්**

සිය වත්මන් තත්ත්වය තහවුරු කරගැනීමට මෙන්ම ආයතනය විවිධාංගීකරණය කර, පුළුල් කිරීම සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සතුව ඉදිරි සැලසුම් ගණනාවක් පවතී.දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය නැවත සකස් කෙරෙමින් පවතිනුයේ, පිටවීමේ මාර්ග තුනක් සතු කරගැනීමට ය. එනම්, පශ්චාද් උපාධි ඩිප්ලෝමාව, ලිඛිත හෝ ප්‍රායෝගික වැඩ මඟින් සිදු කරනු ලබන ශාස්ත්‍රපති උපාධි සහ පර්යේෂණ අංගයක් සහිත ශාස්ත්‍රපති උපාධියයි. මෙම නව, නම්‍යශීලී ව්‍යුහය මඟින් සිය විවිධ වූ අවශ්‍යතා මත පදනම්ව, මෙම වැඩසටහන නිම කිරීමට ශිෂ්‍යයින් හට පහසුකම් සලසා දෙනු ලබයි.මෙම වැඩසටහන සඳහා ලියාපදිංචි වන ශිෂ්‍යයින් ගණනාවක් විසින් ප්‍රධාන පර්යේෂණ ව්‍යාපෘතියක් ඇතුලත් නොවන ශාස්ත්‍රපති උපාධි සුදුසුකමක් දැනට ඉල්ලුම් කරනු ලබන හෙයින්, ලිඛිත හෝ ප්‍රායෝගික වැඩ මඟින් සිදු කරනු ලබන ශාස්ත්‍රපති උපාධිය මඟින් ඔවුන්ට ඉහල පෙළේ නම්‍යශීලී බවක් ලබා දෙනු ලැබේ. එමෙන්ම, දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හා දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ශ්‍රී ලංකා සුදුසුකම් මාර්ගෝපදේශවලට අනුව විධිමත්කරණය කෙරෙමින් පවතී. ආයතනය විසින් පිරිනමනු ලබන පූර්ණකාලීන මුලු වැඩසටහන් සංඛ්‍යාව 4 දක්වා ඉහල නංවමින්, 2018 වර්ෂයේ දී නව පශ්චාද් උපාධි ඩිප්ලෝමා දෙකක් සඳහා ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීමට ද පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සැලසුම් කරනු ලැබේ. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් 2018 වර්ෂයේ දී ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටි පාඨමාලාවක් ඇතුලත් නව කෙටි පාඨමාලා පිරිනැමීමට සැලසුම් කරනු ලබන අතර, එය සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පශ්චාද් උපාධි අධ්‍යාපනය තුල වර්ධනය වෙමින් පවතින ක්ෂේත්‍රයක් බවට පත්ව ඇත.

පරිපාලනය සම්බන්ධයෙන්, 2018 වර්ෂයේ දී කළමනාකරණ තොරතුරු පද්ධතියක් සඳහා අභිලාශ ප්‍රකාශ කිරීම් ඇගයීමටත්, එම පද්ධතියේ සංවර්ධන වැඩ කටයුතු ආරම්භ කළ හැකි පරිදි එම කොන්ත්‍රාත්තුව පිරිනැමීමටත් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සැලසුම් කරනු ලැබේ. අඛණ්ඩ වෘත්තීය සංවර්ධන ක්‍රියාකාරකම්හි කොටසක් ලෙස, උපයන ලද අරමුදල් උපයෝගී කරගනිමින් අවම වශයෙන් එක් පරිපාලන කාර්යමණ්ඩල සාමාජිකයෙකු විදෙස් පුහුණු වැඩසටහනක් සඳහා යැවීමට ද සැලසුම් පවතී.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ක්‍රියාකාරීව කටයුතු කරනු ලබන තවත් ප්‍රධාන ක්ෂේත්‍රයක් වනුයේ, ආයතනික පර්යේෂණ හා රාජ්‍ය නොවන මූලාශ්‍ර වෙතින් පර්යේෂණ අරමුදල් ලබා ගැනීමේ හැකියාව යි.පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් මීට පෙර පර්යේෂණ ප්‍රදානයක් ලබාගෙන නොමැති හෙයින්, 2018 වර්ෂයේ දී ක්‍රියාකාරී ලෙස සොයා බලනු ලබන ක්ෂේත්‍රයක් බවට මෙය පත් වේ.

(ඉ) දේශීය සිසුන් පිළිබඳ විස්තර

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | 2017 වර්ෂයේ දී ඇතුලත්කරගැනීම් | පළමු වසර සිසුන් (I කොටස) | දෙවන වසර සිසුන් (II කොටස) | උපාධිය ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය | දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | ඉංග්‍රීසි | නව ඇතුලත්කරගැනීම්– 14 (නැවත ලියාපදිංචි වන ලද - 39) | - | - | 09 |
| | දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව/ ශාස්ත්‍රපති උපාධිය | ඉංග්‍රීසි | නව ඇතුලත්කරගැනීම්– 55 (නැවත ලියාපදිංචි වන ලද - 80) | 97 | 38 | 04 |
| | දෙවන බස පසුබිමක් තුල ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | ඉංග්‍රීසි | නව ඇතුලත්කරගැනීම් - 23 (නැවත ලියාපදිංචි වන ලද- 35) | 39 | 19 | - |
| මුළු සංඛ්‍යාව | 03 | - | 246 | 136 | 57 | 13 |

(ඊ) අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර

| ආයතනය | විෂයය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | පරිවාස කථිකාචාර්ය | උපදේශක වරුන් |
|---|---|---|---|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය | | ඉංග්‍රීසි | - | 01 | 03 | - | 01 | 01* |
| මුළු සංඛ්‍යාව | | - | - | 01 | 03 | - | 01 | 01 |

* කොන්ත්‍රාත් පදනම මත කථිකාචාර්ය

(උ) අනධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර

| ආයතනය | ජ්‍යෙෂ්ඨතම | ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලය | කණිෂ්ඨ කාර්යමණ්ඩලය | සුළු සේවකයින් |
|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය | - | 02 | 05 | 02 |
| මුළු සංඛ්‍යාව | - | 02 | 05 | 02 |

(ඉ) පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශනවල විස්තර

| විෂයය | ප්‍රකාශිත | වාණිජකරනය කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 01 | - | 07 |
| ආ. නවෝත්පාදන සංඛ්‍යාව | - | - | - |
| ඇ. සඟරා සංඛ්‍යාව | - | - | - |
| ඈ. ග්‍රන්ථ සංඛ්‍යාව | 01 | - | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | 01 | - | - |
| ඊ. වෙනත් | - | - | - |

(එ) වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර

| විෂයය | සහභාගි වූ | සම්පූර්ණ කරන ලද | පවත්වන ලද |
|---|---|---|---|
| අ. පශ්චාද් උපාධි වැඩසටහන් සංඛ්‍යාව | - | - | 02 |
| ආ. පශ්චාද් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | - | - | 01 |
| ඇ. උපාධිවැඩසටහන් සංඛ්‍යාව | - | - | - |
| ඈ. ඩිප්ලෝමා සංඛ්‍යාව | - | - | - |
| ඉ. සහතිකපත්‍ර වැඩසටහන් සංඛ්‍යාව | - | - | 05 |
| ඊ. වෙනත් | - | - | 04 |
| මුළු සංඛ්‍යාව | - | - | 12 |

(ඒ) පවත්වන ලද සහතිකපත්‍ර වැඩසටහන් සංඛ්‍යාව

| | පාඨමාලාවේ නම | කාලසීමාව | මාධ්‍යය | ශිෂ්‍යයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අ.පො.ස සාමාන්‍ය පෙල නව විෂය නිර්දේශය සඳහා ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීමේ ගුරු ශක්‍යතා ඉහල නැංවීම පිළිබඳ කෙටි පාඨමාලාව | පැය 22 (පෙබරවාරි 22 – අප්‍රේල් 05) | ඉංග්‍රීසි | 40 |
| 2 | සමාජ විද්‍යාවන් හා මානව ශාස්ත්‍රයන්හි අධ්‍යයන ලිවීම් සහ පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටි පාඨමාලාව | පැය 32 (මාර්තු 06 – මැයි 24) | ඉංග්‍රීසි | 30 |
| 3 | බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අභ්‍යන්තර උපදේශකයින් හා සහකාර අධ්‍යක්ෂවරුන් සඳහා ධාරිතා සංවර්ධන සම්මන්ත්‍රණය | දින 03 (අප්‍රේල් 26 - 28) | ඉංග්‍රීසි | 49 |
| 4 | අ.පො.ස උසස් පෙල ඉංග්‍රීසි සාහිත්‍යය නව විෂය නිර්දේශය පිළිබඳ කෙටි පාඨමාලාව | පැය 45 (සැප්තැම්බර් 11- නොවැම්බර් 20) | ඉංග්‍රීසි | 26 |
| 5 | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍රය න්හි අධ්‍යයන ලිවීම් සහ පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටි පාඨමාලාව | පැය 32 (ඔක්තෝබර් - දෙසැම්බර්) | ඉංග්‍රීසි | 28 |

## (ඔ) වෙනත් ක්‍රියාකාරකම්

## <u>2017 වර්ෂය තුල පවත්වන ලද වැඩමුළුවල විස්තර</u>

| | පාඨමාලාවේ නම | කාලසීමාව | මාධ්‍යය | ශිෂ්‍යයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ශ්‍රී ලාංකේය සමාජ විද්‍යාවන්, දේශපාලනයේ සහ කලාවන්හි 'ග්‍රාමීය' පරිකල්පනය පිළිබඳ පර්යේෂණ වැඩමුළුව | **දින 02 (ජූලි 14 - ජූලි 15)** | ඉංග්‍රීසි | **30** |
| 2 | ලාංකේය අධ්‍යයනය සඳහා වන ඇමෙරිකානු ආයතනය විසින් අනුග්‍රාහකත්වය ලබා දෙන භාෂා ඇගයීම් වැඩමුළුව | **පැය 22 (ජූලි 25)** | ඉංග්‍රීසි | **30** |
| 3 | ලිවීම් උපදේශකවරුන් සඳහා පීඨමය සංවර්ධන වැඩමුළුව | **පැය 2 (අගෝස්තු 4)** | ඉංග්‍රීසි | **17** |

## <u>2017 වර්ෂය තුල පවත්වන ලද ආරාධිත දේශන පිළිබඳ විස්තර</u>

| | පාඨමාලාවේ නම | මාධ්‍යය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| **1** | **"In Defense of EFL" :** ආචාර්ය බෲක් ශ්‍රයිබර් විසින් සිදු කරන ලද මහජන දේශනය | ඉංග්‍රීසි | **19** |

## (ඕ) අළුතින් අරඹන ලද පාඨමාලාවල විස්තර

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | පශ්චාද් උපාධි සහතිකපත්‍ර | පශ්චාද් උපාධි ඩිප්ලෝමා | ශාස්ත්‍රපති | දර්ශන ශූරී | දර්ශන විශාරද |
|---|---|---|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය | ද්වීභාෂික අධ්‍යාපනය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබන තෙක්) | ඉංග්‍රීසි | - | පශ්චාද් උපාධි ඩිප්ලෝමා<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලද පාඨමාලාව 2018 දී පිරිනැමීමට නියමිතය | - | - | - |
| | ඉංග්‍රීසි භාෂාව වෘත්තීය ලෙස යොදාගැනීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබන තෙක්) | | - | පශ්චාද් උපාධි ඩිප්ලෝමා<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලද පාඨමාලාව 2018 දී පිරිනැමීමට නියමිතය | - | - | - |

## 3. කළමනාකරණ සහ පරිපාලන ප්‍රගතිය

අ) පරිපාලන කාර්යමණ්ඩල සාමාජිකයින් විසින් පහත සඳහන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වන ලදී.

- විශ්වවිද්‍යාල කාර්මණ්ඩලය සඳහා විනය ක්‍රියාමාර්ග පිළිබඳ වැඩමුළුව - සහභාගි වූයේ එක් අයෙකි.
- ගබඩා කළමනාකරණය සහ මිලදී ගැනීමේ ක්‍රමවේද - සහභාගි වූයේ එක් අයෙකි.
- නව වැටුප් සංශෝධනය හා වෙනත් මූල්‍ය කරුණු පිළිබඳ වැඩමුළුව - සහභාගි වූයේ තිදෙනෙකි.
- මිලදී ගැනීම සහ සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව - සහභාගි වූයේ එක් අයෙකි.

ආ) අධ්‍යයන කාර්යමණ්ඩලය - ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා වැඩමුළු ගණනාවක් සඳහා සහභාගි වන ලදී.

- භාෂා හා සංවර්ධන සමුළුව - බ්‍රිතාන්‍ය කවුන්සිලය, ඩකාර්, සෙනෙගාලය, බටහිර අප්‍රිකාව
- දකුණු ආසියානු සාහිත්‍යය තුල ත්‍රස්තය නියෝජනය කිරීම, නෝතර්ර්ස්ටනර් හිල් විශ්වවිද්‍යාලය, ශිලෝන්ග්, ඇසෑම්, ඉන්දියාව
- ශ්‍රී ලංකා ඉංග්‍රීසි භාෂා ගුරුවරුන්ගේ සංගමයේ ද්වි වාර්ෂික ජාත්‍යන්තර සම්මන්ත්‍රණය
- උසස් අධ්‍යාපන කායර්ක්ෂමතාව වැඩිදියුණුකිරීම සඳහා වන ශ්‍රී ලංකා සංගමයේ (SLAIHEE) සමුළුව
- විවෘත හා නවෝත්පාදක අධ්‍යාපනය (ICOIE 2017) පිළිබඳ ජාත්‍යන්තර සමුළුව, හොංකොං විවෘත විශ්වවිද්‍යාලය
- අධ්‍යාපනය තුල පර්යේෂණ සඳහා වන ඕස්ට්‍රේලියානු සංගමයේ සමුළුව, ඕස්ට්‍රේලියානු ප්‍රධාන බලප්‍රදේශය
- "ශ්‍රී ලංකාව තුල ක්‍රියාකාරී පර්යේෂණ දියත් කිරීම: ඇතුලත් කිරීමට හා සමාජ ඒකාග්‍රතාවය වෙත මාවත". බ්‍රිතාන්‍ය කවුන්සිලය, කොළඹ
- සමාජ ඒකාග්‍රතාවය හා සංහිඳියාව සැලසුම් කිරීමේ වැඩමුළුව. සාමය පිළිබඳ අධ්‍යාපනය සහ සංහිඳියා ඒකකය (PERU) අධ්‍යාපන අමාත්‍යාංශය: බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ.
- ලෝක අධ්‍යාපන පර්යේෂණ සංගමය (WERA). හොංකොං අධ්‍යාපන විශ්වවිද්‍යාලය: හොංකොං

ඇ) 2018 වර්ෂය සඳහා වන වාර්ෂික සැලසුම් වැඩකටයුතු අදියර දෙකකින් සිදු කරන ලදී. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේදී දෙසැම්බර් 11 වන දින මූලික සැලසුම් අවස්ථාවක් පවත්වන ලද අතර, එය සහක්‍රියාව හා කණ්ඩායම් ගොඩනැංවීම පිණිස, වැඩ කරන දිනයකින් බැහැර දිනයක ලෙස 18 වන දෙසැම්බර් දින පැවැතිඑක් දින වැඩමුළුවකදී 2018 වර්ෂය සඳහා වාර්ෂික සැලැස්ම සකස් කිරීම මඟින් ඉදිරියට ගෙන යන ලදී.

ඈ) පහත සඳහන් අස්පෘශ්‍ය/ස්පෘශ්‍ය වත්කම් අත්පත්කරගැනීම පිණිස, ටෙන්ඩර් ලියවිලි සහ පිරිවිතරයන් සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු හඳුනා ගැනීමට සාකච්ඡා රැස්වීම් හා මූලික අදියරේ තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් පවත්වන ලදී (2018 වර්ෂයේ දී අත්පත්කරගැනිමට නියමිත)

- කළමනාකරණ තොරතුරු පද්ධතිය
- ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - වහලය සහ රථගාල හා සේවා ප්‍රදේශය

ඉ) නව ගොඩනැඟිලි ආශ්‍රිත ක්‍රියාකාරකම්

- නව ගොඩනැඟිල්ලේ පවත්නා අඩුපාඩු සහ එම අඩුපාඩු නිවැරදි කරගැනීමට පවත්නා ප්‍රමාදය පිළිබඳව දැනුම්දීම සඳහා කොන්ත්‍රාත්කරු සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් අතර ගොඩනැඟිලි කමිටු රැස්වීම් සහ සාකච්ඡා ගණනාවක් පවත්වන ලදී.

ඊ) 2016 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්ෂික සකස් කිරීම

2016 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සකස් කිරීම අරඹන ලද්දේ ජනවාරි මාසයේ දී වන අතර, 2016 මාර්තු මස මැද දී අවසන් කරන ලදුව, මාර්තු 17වන දින පාලක මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2016 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව පිළිබඳව සාකච්ඡා කර, පිළිගන්නා ලද්දේ 2017 ඔක්තෝබර් මස 02 වන දින දී ය.

## යටිතල පහසුකම්වල ප්‍රගතිය

### ගෘහභාණ්ඩ, උපකරණ හා වෙනත් වත්කම් අත්පත්කරගැනීම

සිය නව ගොඩනැඟිල්ල ආරම්භ කිරීමත් සමඟම, 2016 සහ 2017 වර්ෂය තුළ දී ලබා දී ඇති ප්‍රාග්ධන ප්‍රදාන මඟින් 2017 වර්ෂය තුළ දී ආයතනය විසින් නව ගෘහභාණ්ඩ හා උපකරණ අත්පත්කරගැනීම ආරම්භ කරන ලදී.

- කිලෝවොට් ඇම්පියර් 125ක විදුලි ජනන යන්ත්‍රයක් සපයාදීම සහ සවිකිරීම සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ජනවාරි මස ආරම්භ කරන ලද අතර, 2017 ඔක්තෝබර් මස ක්‍රියාත්මක කරන ලදී.
- මඟී සෝපානය සපයා දීම සහ සවිකිරීම සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ජනවාරි මස ආරම්භ කරන ලද අතර, 2017 දෙසැම්බර් මස ක්‍රියාත්මක කරන ලදී.
- කාර්යාල කටයුතු සඳහා නව ඩෙස්ක්ටොප් පරිගණක හා අධ්‍යයන කාර්යමණ්ඩලයේ භාවිතය උදෙසා ලැප්ටොප්මිලදී ගන්නා ලදී.
- 2017 වර්ෂය තුළ සම්මන්ත්‍රණ කාමරය සඳහා ශ්‍රවණාගාර පුටු හා මණ්ඩල කාමරය සඳහා මේස/පුටු, කාර්යාලය හා අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා කායර්ාල කබඩ් යනාදිය මිලදී ගන්නා ලදී.
- දේශනා ශාලා සඳහා ප්‍රොජෙක්ටර, ශබ්ද පරිපාලක යන්ත්‍ර මිලදී ගෙන, සවි කරන ලදී.
- පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍යයින් හා අනෙකුත් අයගේ ප්‍රතිලාභය වෙනුවෙන් ප්‍රධාන පුස්තකාලයේ තැබිය යුතු අත්‍යවශ්‍ය පොත් සපයා දීම පිණිස වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

වගුව 1 – 2016/2017 අවසන් ඇගයීමේ දී ශිෂ්‍ය කාර්යසාධනය
දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව/ශාස්ත්‍රපති උපාධිය (TESL)

| | ඉංග්‍රීසි භාෂා ප්‍රතිශතය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1301 | 1201 | 1202 | 1203 | 1101 | 1102 | 1103 | 1104 | 1105 | 2101 | 2102 | 2301 |
| ලියාපදිංචි වූ | 70 | 70 | 53 | 63 | 50 | 52 | 39 | 11 | 09 | 26 | 27 | 05 |
| සුදුසුකම්ලත් | 51 | 52 | 37 | 42 | 35 | 39 | 23 | 08 | 08 | 25 | 24 | 05 |
| මුහුණ දුන් | 41 | 39 | 35 | 39 | 29 | 33 | 20 | 07 | 06 | 18 | 19 | 04 |
| සමත් | 41 | 38 | 35 | 34 | 29 | 33 | 20 | 07 | 06 | 18 | 19 | 04 |
| නිමකළ අනුපාතය (%) | 80.4 % | 73.1 % | 94.6 % | 80.9 % | 82.8 % | 75 % | 86.9 % | 87.5 % | 75 % | 72 % | 79.2 % | 80 % |

වගුව 2 – 2016/2017 අවසන් ඇගයීමේ දී ශිෂ්‍ය කාර්යසාධනය
දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (TLSC)

| | භාෂාව ඉගැන්වීමේ ප්‍රතිශතය | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1201 | 1202 | 1101 | 1102 | 1103 | 1104 | 1105 | 1203 | 1204 | 1106 | 1107 | 2101 | 2102 | 2103 |
| ලියාපදිංචි වූ | 27 | 28 | 27 | 27 | 15 | 31 | 13 | 23 | 09 | 10 | 10 | 14 | 11 | 12 |
| සුදුසුකම්ලත් | 17 | 19 | 21 | 16 | 08 | 17 | 06 | 12 | 08 | 08 | 09 | 12 | 09 | 10 |
| මුහුණ දුන් | 16 | 18 | 17 | 15 | 08 | 12 | 06 | 10 | 08 | 08 | 09 | 10 | 09 | 09 |
| සමත් | 16 | 18 | 17 | 13 | 08 | 11 | 06 | 10 | 08 | 06 | 09 | 10 | 09 | 09 |
| නිමකළ අනුපාතය (%) | 94.1 % | 94.7 % | 80.9 % | 81.2 % | 100 % | 64.7 % | 100 % | 83.3 % | 100 % | 75 % | 100 % | 83.3 % | 100 % | 90 % |

**පර්යේෂණ**

**පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ශිෂ්‍ය පර්යේෂණ ආශ්‍රිත අවස්ථාවන් ගණනාවක් 2017 වර්ෂයේදී පවත්වන ලදී.**

**සිය නිබන්ධන ආරම්භ කිරීමට සූදානම් වන ශාස්ත්‍රපති ශිෂ්‍යයින් හට සිය පර්යේෂණ අදහස් ජාතික විශ්වවිද්‍යාල ගණනාවකින් සැදුම්ලත් ප්‍රමුඛ පෙළේ විද්වත් මඬුල්ලක් වෙත ඉදිරිපත් කර, ප්‍රතිපෝෂක ලබා ගැනීම පිණිස, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිය පර්යේෂණ සංසදය පවත්වන ලදී. විවිධ පරාසයන්හි විහිදුණු මාතෘකා යටතේ පර්යේෂණ සිදු කරනු ලබන දීප ව්‍යාප්ත ශිෂ්‍යයින් විසින් සංසදයේදී ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.**

- **දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම - 2017 ජූලි 24 - ශිෂ්‍යයින් 10**
- **දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම(TESL)– 2017 ජනවාරි 26 - ශිෂ්‍යයින් 36**

**පර්යේෂණ මාතෘකා ලැයිස්තුව**

<u>දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය</u>

- Investigating the extent of developing critical thinking through teaching English literature in the Grade 11 classroom
- Impact of supplementary material in helping students interpret short stories in the A/L literature syllabus
- The use of literature in the language classroom to overcome students’ inhibitions in the EAP class
- An exploration of the reception of Magic Realism concepts in relation to the familiarity with Sinhala *sandeshakavyas*, folklore and *jathaka* stories
- Perspectives and attitudes of Sri Lankan teachers towards exploring taboo/controversial social issues prevalent in literary texts
- Language teacher professional development: A descriptive study of Sri Lankan English literature teachers' existing practices and needs
- Significance of literature in improving the vocabulary usage in writing first year undergraduates
- The teachers’ use of School Based Assessment (SBA) tools in English Literature assessments
- Quest for an effective collaborative teaching platform: The use of Facebook to improve creative writing and critical thinking skills of students in Colombo and Anuradhapura
- Teachers’ beliefs and the usages of GCE O/L English Literature teachers’ resource book

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, සුනිල් හෙට්ටිආරච්චි මහතා ප්‍රධාන අමුත්තා ලෙස සහභාගිත්වයෙන් සිය ප්‍රථම පර්යේෂණ සංසදය ද පවත්වන ලදී. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කරන ලද ශිෂ්‍යයින්ගේ වැඩකටයුතු පිළිබඳව ඉදිරිපත් කළ ප්‍රථම අවස්ථාව මෙය වේ.මෙම ඉදිරිපත්කිරීම් මඟින් වෙනස් වූ පරාසයක් විහිදුණු මාතෘකා මෙන්ම පර්යේෂණ ප්‍රවේශයන් ද ආවරණය කරන ලදී.

- ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ (ELT) ගෝලීය මානයන්
- CALL පදනම් වූ ඉංග්‍රීසි භාෂාව විදේශ භාෂාවක් ලෙස EFL ලිවීමේ වැඩසටහන වෙත පවත්නා අකැමැත්ත හා ප්‍රතිරෝධය: යාපනය විශ්වවිද්‍යාලයේ පවත්වන ලද අධ්‍යයනයක්
- සහයෝගිතාව හෝ සාමූහිකත්වය? විශ්වවිද්‍යාලයක ඉංග්‍රීසි භාෂාව දෙවන බස ලෙස ඉගැන්වීමේ පන්ති කාමරයක සහයෝගී භාෂා ඉගෙනීම භාවිත කිරීමේ ඵලදායීත්වය
- දෙවන භාෂා (L2) ව්‍යාකරණ වීඩියෝ මඟින් ව්‍යාකරණ ඉගෙනීම : විවිධාංගීකරණය වූ අත්දැකීම
- එක් එක් පුද්ගල ලිවීම් මත සහයෝගීතාවයේ බලපෑම : ද්විතියික පාසල් ශිෂ්‍යයින්ගේ අධ්‍යයනයක්
- ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම තුල ඉගෙනුම්කාරකයාගේ සංවේදීභාවය පිළිබඳ ගවේෂණය කිරීමක්

ඉගෙනුම ලබන්නාගේ සහාය

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිය යෝජනා ඉදිරිපත් කිරීමට සැරසෙන පර්යේෂණ ශිෂ්‍යයින් වෙනුවෙන්ප්‍රබල මුහුණට මුහුණ උපදෙස් ලබාදීම් සිදු කරන ලදී.මෙය කාලය සමඟ සටන් කරමින් සිදු කළ යුතු ක්‍රියාකාරකමක් මෙන්ම වෙන් වෙන් වූ ශාස්ත්‍රපති වැඩසටහන් දෙකක් සඳහා සිදු කළ යුතු වුවද, වඩාත් අවධානාත්මක ලෙස සහ උසස් තත්ත්වයේ පර්යේෂණ යෝජනා ඉදිරිපත්කිරීමෙහිලා ශිෂ්‍යයින් වෙත සහාය පළකිරීමේ සාර්ථක උපායමාර්ගයක් බවට එය සාක්ෂි දරනු ලැබ ඇත. සමකාලීන ශිෂ්‍යයින්ගේ සහාය සහ ඉලක්කගත උපදේශක යෙදවුම් ලබාදීමේ ක්‍රමයක් ලෙස දැනට පර්යේෂණවල නියුතු ශිෂ්‍යයින් වෙත උපකාර කිරීමට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් NEO-LMS වේදිකාවක් ලෙස භාවිත කරනු ලබයි.

ඊට අතිරේකව, සියලුම ශිෂ්‍ය ගැටලු එක්රැස්කිරීමට හා ප්‍රතිපෝෂක ලබාදීමට ඉගැන්වීම් කාර්යමණ්ඩලයට හැකි වන පරිදි, ඇගයීම් අතරතුර දී, ශිෂ්‍යයින් හට ගැටලු හුවමාරු කරගැනීමට ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් දෙකෙහිම සම්බන්ධීකාරකවරුන් විසින් අන්තර්ජාලමය වේදිකාවක් නිර්මාණය කරනු ලැබ ඇත.

ආරාධිත ඇමෙරිකානු විද්වතෙකු මඟින් පරීක්ෂණ හා ඇගයීම් පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම පිණිස, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින්ශ්‍රී ලාංකික අධ්‍යයනය සඳහා වන ඇමෙරිකානු ආයතනය සමඟ ද අත්වැල් බැඳගන්නා ලදී.මෙම වැඩමුළුවට සහභාගි වූ අය අතර, භාෂා අධ්‍යාපනය තුල පරීක්ෂණ හා ඇගයීම්හි නවතම ප්‍රවණතා පිළිබඳව උපදෙස් ලද පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශාස්ත්‍රවේදී හු මෙන්ම ආරාධිත ශාස්ත්‍රවේදී හු ද සිටියහ.

**කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ ක්‍රියාකාරකම්**

**ආචාර්ය එච්.එස්.රඹුක්වැල්ල, අධ්‍යක්ෂ**

**ප්‍රකාශන**

**හර්ෂණ රඹුක්වැල්ල.2017 "Locations of authenticity: S.W.R.D. Bandaranaike of Sri Lanka and the search for indigeneity."*Journal of Asian Studies.* 76(2): 383-400**
**කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය**

| ක්‍රියාකාරකම | ආයතනය |
|---|---|
| විශේෂ අධ්‍යයන කාර්යයන් සඳහා ඉංග්‍රීසි (ESAP) පාඨමාලාව | මොරටුව විශ්වවිද්‍යාලය |
| ජ්‍යෙෂ්ඨ හඳුන්වාදීමේ පුහුණු වැඩසටහන, "පර්යේෂණ කුසලතා - පර්යේෂණ සොයාගැනීම් ඉදිරිපත් කිරීම" | සංවර්ධන මධ්‍යස්ථානයේ කාර්යමණ්ඩලය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| ජෛවවිද්‍යා ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති ශිෂ්‍යයින් සඳහා පර්යේෂණ සන්නිවේදනය සහ අධ්‍යයන ලිවීම් | වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| දර්ශනශූරී හා දර්ශනපති ශිෂ්‍යයින් සඳහා පර්යේෂණ සන්නිවේදනය, අධ්‍යයන ලිවීම් සහ පර්යේෂණ ක්‍රම | පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| අපොස උසස් පෙළ ඉංග්‍රීසි සාහිත්‍යය නවකථා සහ කෙටිකථා සඳහා පුනරීක්ෂණ දේශන වෙනුවෙන් සම්පත්දායක | බ්‍රිතාන්‍ය කවුන්සිලය, මහනුවර |
| අපොස උසස් පෙළ ඉංග්‍රීසි සාහිත්‍යය නවකථා සහ කෙටිකථා සඳහා පුනරීක්ෂණ දේශන වෙනුවෙන් සම්පත්දායක | බ්‍රිතාන්‍ය කවුන්සිලය, කොළඹ |
| පර්යේෂණ ක්‍රම පිළිබඳ එක්දින වැඩමුළුව සඳහා සම්පත්දායක | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, යාපනය විශ්වවිද්‍යාලය |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානයේ thinkers සම්මන්ත්‍රණ මාලාවේ දේශක (Edward Said and Critical Humanism පිළිබඳව) | බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානය |
| ජාතික විෂයමාලා පුනරීක්ෂණ යෝජනාව අධ්‍යයනය කිරීම සඳහා පත්කරන ලද කමිටුවේ සභාපති | ජාතික අධ්‍යාපන ආයතනය |

| ක්‍රියාකාරකම | ආයතනය |
|---|---|
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන කැනේඩියානු පර්යේෂණ මධ්‍යස්ථානය (IDRC) මඟින් අරමුදල් සපයන ලද, වාර්ෂික අධ්‍යයනය සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකාවේ කාන්තාවන් සඳහා පශ්චාද් යුධකාල සීමාව තුල වර්ධනය සහ ආර්ථිකමය අවස්ථා (GrOW) | වාර්ෂික අධ්‍යයනය සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICES) |
| නිර්මාණාත්මක ඉංග්‍රීසි භාෂාව ලිවීම සඳහා වන ග්‍රේෂන් සම්මානය පරිපාලනය කරනු ලබන ග්‍රේෂන් භාරයේ භාරකරුවන් | ග්‍රේෂන් භාරය |
| සිංහල නවකථා සඳහා වන ස්වර්ණපුස්තක සම්මාන උළෙලේ අවසන් වටයේ විනිසුරු | ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය |
| සාහිත්‍යය පිළිබඳ ජාතික අනුකමිටුවේ සාමාජික | සංස්කෘතික දෙපාර්තමේන්තුව, සංස්කෘතික අමාත්‍යාංශය |
| අන්තර් පාසල් ෂේක්ස්පියර් තරඟාවලියේ අවසන් වටයේ විනිසුරු | උතුරු කොළඹ රොටරි සමාජය හා තරුණ පිරිමි ක්‍රිස්තියානි සංගමය |
| විවෘත විශ්වවිද්‍යාලයීය කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන සඳහා වන ජාතික සංවර්ධන ඒකකයේ සම්බන්ධීකාරක | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| මණ්ඩල සාමාජික, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය කොළඹ විශ්වවිද්‍යාලය |
| සාමාජික, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා වන ස්ථාවර කමිටුව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| සාමාජික, පශ්චාද් උපාධි අධ්‍යයනය සඳහා වන ස්ථාවර කමිටුව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| උපාධි ප්‍රදානෝත්සවයේ හා සම්මාන කමිටුවේ සාමාජික | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| මණ්ඩල සාමාජික, ජාත්‍යන්තර අධ්‍යයන ඒකකය | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| භාෂා ඇගයීම පිළිබඳ 4වන ජාතික සම්මන්ත්‍රණයේ සහ 19 වන ජාතික RESC සම්මන්ත්‍රණයේ සැසිවාර දේශක | ජාතික අධ්‍යාපන ආයතනය |
| ත්‍රස්ත බලපෑම හා සාහිත්‍යමය ඉදිරිපත්කිරීම : "දකුණු ආසියානු රාමුවක් තුල ඉංග්‍රීසි භාෂාව ශ්‍රී ලාංකේය අයුරින් ලිවීමේ පැතිකඩ" දකුණු ආසියාව තුල ප්‍රචණ්ඩත්වයේ හා ත්‍රස්තවාදයේ හෙළිකිරීම් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරන ලද සැසිවාර පත්‍රිකාව | නොතර්ස්ටනර් හිල් විශ්වවිද්‍යාලය (NEHU), ශිලෝන්ග්, ඇසෑම්, ඉන්දියාව |

| ක්‍රියාකාරකම | ආයතනය |
|---|---|
| "භාෂාව හා සංහිඳියාව: ශ්‍රී ලාංකේය අත්දැකීම හරහා සබඳතාව පිළිබඳ නැවත සිතීම" භාෂා හා තිරසර සංවර්ධන අරමුණු සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරන ලද පත්‍රිකාව | බ්‍රිතාන්‍ය කවුන්සිලය හා ලන්ඩන් විශ්වවිද්‍යාලයේ පෙරදිග හා අප්‍රිකානු අධ්‍යයනය සඳහා වන පාසල, ඩකාර්, සෙනෙගාලය මඟින් |

**එච්.ඩී.විජේසේකර මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

| දිනය | ක්‍රියාකාරකම | ආයතනය |
|---|---|---|
| **2017** | ආචාර්ය උපාධි නිබන්ධනය ලිවීම හා අධ්‍යාපන පීඨයේ අභ්‍යන්තර පරීක්ෂණය සඳහා ඉදිරිපත් කිරීම | තාක්ෂණවේදය පිළිබඳ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව |
| **2017** | උසස් උපාධි පර්යේෂණ ශිෂ්‍ය කමිටුව - කමිටු සාමාජික - 2017 | තාක්ෂණවේදය පිළිබඳ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය |
| **2017** | සාමාජික - උසස් උපාධි පර්යේෂණ ශිෂ්‍ය කමිටුවේ ද්විවාෂරීක සම්මන්ත්‍රණයේ සංවිධායක කමිටුව - 2017 | තාක්ෂණවේදය පිළිබඳ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය |
| **2017** | සාමාජික - සාරාංශ සමාලෝචනය කිරීමේ කමිටුව - උසස් උපාධි පර්යේෂණ ශිෂ්‍ය කමිටුවේ ද්විවාෂරීක සම්මන්ත්‍රණය - 2017 | තාක්ෂණවේදය පිළිබඳ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය |
| **ජූනි 2017** | සැසිවාර මුලසුන, වාර්ෂික පර්යේෂණ හා ප්‍රකාශන සතිය 2017 | තාක්ෂණවේදය පිළිබඳ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය |
| **ජූනි 2017** | "අධ්‍යයන සම්මන්ත්‍රණයක දී උපරිමය ලබාගැනීම: ක්‍රියාවලීන්, ක්‍රියාවේ යෙදවීම සහ ඉඟි" (සම ඉදිරිපත්කරන්නා) වාර්ෂික පර්යේෂණ හා ප්‍රකාශන සතිය 2017හිදී සිදු කරන ලද ඉදිරිපත් කිරීම | තාක්ෂණවේදය පිළිබඳ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය |
| නොවැම්බර් **2017** | "ශ්‍රී ලංකාවේ ද්විභාෂික පන්ති කාමර තුල ශිෂ්‍යයින්ගේ වාර්ෂික වාග්විද්‍යා හඳුනාගැනීම් සහ වාග්විද්‍යාත්මක වෙළඳපොල" පිළිබඳ පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම (AARE, 2017) | අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ සඳහා වන ඕස්ට්‍රේලියානු සංගමයේ සම්මන්ත්‍රණය, ඕස්ට්‍රේලියානු ප්‍රධාන බලප්‍රදේශය, 2017 නොවැම්බර් 26 - 30 |

| දිනය | ක්‍රියාකාරකම | ආයතනය |
|---|---|---|
| 2017 3වන හා 4වන කාර්තු | කමිටු සාමාජික (ආරාධිතව)- අධ්‍යාපන පීඨයේ පර්යේෂණ හා නවෝත්පාදක කමිටුව | තාක්ෂණවේදය පිළිබඳ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය |

**ආචාර්ය ශ්‍රීමාලි හේරත් මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

ප්‍රකාශන

Gagné, A. Herath, S., & Valencia, M. (2017). Autobiographical creation: A powerful professional development strategy for teachers. In J. Cummings & M. Blatherwick (eds.), *Creative Practices in Curriculum and Teaching in the 21st Century*. Alberta: Brush Publications.

Gagné, A. Herath, S., & Valencia, M. (2017). Strategies to engage and transform teacher learners in an online course. In J. Cummings & M. Blatherwick (eds.), *Creative Practices in Curriculum and Teaching in the 21st Century.* Alberta: Brush Publications.

Herath, S. (2017). Action research: A route to inclusion and social cohesion. In M. Froggett and S. Herath (Eds.), *Action research in Sri LankaL: A route to inclusion and social cohesion*(pp. 9 - 19). Colombo: British Council. Froggett, M. and Herath, S. (Eds.) (2017). *Action research in Sri Lanka: A route to inclusion and social cohesion.* Colombo: British Council.

Froggett, M. and Herath, S. (Eds.) (2017). *Action research in Sri Lanka: A route to inclusion and social cohesion.* Colombo: British Council.

| දිනය | ක්‍රියාකාරකම | ආයතනය |
|---|---|---|
| පෙබරවාරි | දේශක:<br>ක්‍රියාකාරී පර්යේෂණ හා ඇතුලත් කිරීම සහ සමාජ ඒකාග්‍රතාවය තුල එහි භූමිකාව. *ක්‍රියාකාරී පර්යේෂණ: ඇතුලත් කිරීම සහ සමාජ ඒකාග්‍රතාවය වෙත මාගර්යක් දොරට වැඩීම* | බ්‍රිතාන්‍ය කවුන්සිලය, කොළඹ |
| | මඩුල්ලේ සාමාජික:<br>හේරත්, එස්., ෆ්‍රොගෙත්, එම්. දේවප්‍රිය ඒ හා සමරවීර වයි. (2017).<br>සහභාගිත්ව ක්‍රියාකාරී පර්යේෂණ : ඇතුලත් කිරීම සහ සමාජ ඒකාග්‍රතාවය වෙත මාගර්යක් යන මැයෙන් ශ්‍රී ලංකා ඉංග්‍රීසි භාෂා ගුරුවරුන්ගේ සංගමයේ ද්විවාර්ෂික ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | ශ්‍රී ලංකා ඉංග්‍රීසි භාෂා ගුරුවරුන්ගේ සංගමය,<br>ජාතික අධ්‍යාපන ආයතනය : කොළඹ |

| දිනය | ක්‍රියාකාරකම | ආයතනය |
|---|---|---|
| මාතර් | ආරාධිත දේශක<br><br>සමාජ ඒකාග්‍රතාව හා සාමය සඳහා වන අධ්‍යාපනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම (2008): තිරසර සංවර්ධනය කරා යන නව පසුබිම සඳහා උපායමාගර්යන්. සාමය පිළිබඳ අධ්‍යාපනය හා සංහිඳියා ඒකකය (PERU), අධ්‍යාපන අමාත්‍යාංශය: බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ | සාමය පිළිබඳ අධ්‍යාපනය හා සංහිඳියා ඒකකය (PERU), අධ්‍යාපන අමාත්‍යාංශය හා ONUR |
| අප්‍රේල්(ඉදිරිය ට) | සාමාජික:<br>විවෘත විශ්වවිද්‍යාලය MOOC කමිටුව | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| ජූලි | සමාලෝචක:<br>කල්‍යාණී සඟරාව | කැලණිය විශ්වවිද්‍යාලය |
| | පරීක්ෂක:<br>ඉංග්‍රීසි භාෂාව අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියේ නිබන්ධන පරීක්ෂක | කොළඹ විශ්වවිද්‍යාලය |
| අගෝස්තු | සාරාංශ සමාලෝචක<br>ඉංග්‍රීසි භාෂා අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික පර්යේෂණ සංසදය | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| | සංස්කාරක මණ්ඩලය<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සඟරාව | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| | සැසිවාර දේශක:<br>දෙවන බස ගුරු අධ්‍යාපනයේ පුළුල් වන විෂය පථය ADEs/DDEs (ඉංග්‍රීසි) සඳහා වන ජාතික සම්මන්ත්‍රණය | භාෂා අධ්‍යයනාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව |
| සැප්තැම්බර් | මඩුල්ලේ සාමාජික:<br>හේරත්, එස්., නාගස්වත්ත කේ., ගමගේ, එස්, කාලිංග, ජේ., සහ පෙරේරා, කේ. (2017). ඉංග්‍රීසි දෙවන බසක් ලෙස ඉගෙනීම පිළිබඳ පර්යේෂණය: පසුබිම් පහකින් විවිධ වූ පැතිකඩ. ඉංග්‍රීසි භාෂා අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සංසදය. කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ. | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ. |
| ඔක්තෝබර් | විෂයමාලා ඇගයුම්කරු :<br>වෘත්තීය සැලසුම සකස් කිරීම - ජාතික වෘත්තීය පුහුණු (NVQ) සුදුසුකම් 5 හා 6 සමඟ සහතික කිරීම් මට්ටම් C1 සහ C2 | තෘතීය හා වෘත්තීය පුහුණු අධ්‍යාපනය පිළිබඳ කොමිෂන් සභාව |
| | සමාලෝචක:<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සඟරාව | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |

| දිනය | ක්‍රියාකාරකම | ආයතනය |
|---|---|---|
| | පර්යේෂණ ප්‍රදාන ලැබුම්කරු:<br>ශ්‍රී ලංකා නෝර්වේ සංගීත සංස්ථාව (Sri Lanka Norway Music Corporation) කුඩා ප්‍රමාණයේ ප්‍රදාන යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා නෝර්වේ සංගීත සංගමය/සේවා ලංකා |
| නොවැම්බර් | සම්බන්ධීකාරක, උසස් අධ්‍යාපනය සඳහා ඉගැන්වීම පිළිබඳ (CTHE):<br>ඉගැන්වීම හා ඉගෙනීම: පාඨමාලා කුසලතා ඉහල නැංවීම<br>විෂයමාලා හා පාඨමාලා සංවර්ධනය<br>පෞද්ගලික අරමුණු සකස් කරගැනීම | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| | මඩුල්ලේ සාමාජික:<br>ගැන්ග්යේ, ඒ., ශ්මිඩ්ට්, සී., මන් වූ ලඋ, එස්., සහ හේරත්, එස්. (2017).<br>පූර්ව සේවාවන්හි අන්තර්සම්බන්ධතාව සහ උපාධිධාරි ගුරු අධ්‍යාපනය: අන්තර්ජාතික පසුබිම්හි විචාරාත්මක පැතිකඩ දිරිගැන්වීම. ලෝක අධ්‍යාපන පර්යේෂණ සංගමය (WERA). හොංකොං අධ්‍යාපන විශ්වවිද්‍යාලය, හොංකොං. | ලෝක අධ්‍යාපන පර්යේෂණ සංගමය (WERA). හොංකොං අධ්‍යාපන විශ්වවිද්‍යාලය: හොංකොං. |

### එම්.අයි.ජැන්ස් මහත්මිය, තාවකාලික කථිකාචාර්ය

| දිනය | ක්‍රියාකාරකම | ආයතනය |
|---|---|---|
| **2017** ජනවාරි | සමාලෝචකයින්ගේ මඩුල්ල - ද්වි වාර්ෂික ජාත්‍යන්තර සමුළුව | ශ්‍රී ලංකා ඉංග්‍රීසි භාෂා ගුරුවරුන්ගේ සංගමය |
| **2017** පෙබරවාරි | පත්‍රිකා ඉදිරිපත් කිරීම<br>"ව්‍යාකරණ: වාග්විද්‍යා අධිරාජ්‍යවාදය සඳහා රියක් ද?" | ද්වි වාර්ෂික ජාත්‍යන්තර සමුළුව<br>ශ්‍රී ලංකා ඉංග්‍රීසි භාෂා ගුරුවරුන්ගේ සංගමය |
| **2017** පෙබරවාරි | ඉදිරිපත් කරන්නා - "සහභාගිත්ව ක්‍රියාකාරී මඩුල්ල" | ද්වි වාර්ෂික ජාත්‍යන්තර සමුළුව<br>ශ්‍රී ලංකා ඉංග්‍රීසි භාෂා ගුරුවරුන්ගේ සංගමය National International of Education (2017) |
| **2017** පෙබරවාරි | පරීක්ෂක - උපාධි අපේක්ෂක නිබන්ධන | ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| **2017** ජනවාරි - පෙබරවාරි **(2016** සිට අඛණ්ඩව) | "ඉංග්‍රීසි භාෂාව හා තොරතුරු තාක්ෂණ කුසලතා ශක්තිමත් කිරීම සඳහා වන විශේෂ කාර්යසාධක බලකාය" වෙත ආරාධිත සාමාජිකයෙකු ලෙස<br><br>**2015/16** විශ්වවිද්‍යාල ප්‍රවේශකයින් වෙත "අන්තර්ජාලය මඟින් ඉංග්‍රීසි භාෂාව" - සමාලෝචක සහ සංස්කාරක | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |

| දිනය | ක්‍රියාකාරකම | ආයතනය |
|---|---|---|
| අප්‍රේල් 2017 | ආරාධිත දේශක - පකුර්ම්පුලාන්<br>Guest Speaker – Perkumpulan<br>"පන්ති කාමරය තුල ශ්‍රී ලංකා ඉංග්‍රීසි ව්‍යාකරණ: අභියෝග සහ අවස්ථාවන් කවරේද?" | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| | සමාලෝචක මඩුලු සාමාජික - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සඟරාව | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 2017 සැප්තැම්බර් | සමාලෝචක - කල්‍යාණී: මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්හි සඟරාව | කැලණිය විශ්වවිද්‍යාලය |
| 2017 | උසස් පෙල සාමාන්‍ය ඉංග්‍රීසි පෙළ පොතේ කතෘවරයෙකු | අධ්‍යාපන ප්‍රකාශන දෙපාතර්මේන්තුව, ශ්‍රී ලංකාව |
| 2017 ජූනි - අගෝස්තු | සාරාංශ සමාලෝචක<br>ඉංග්‍රීසි භාෂාව අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සංසදය | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 2017 ජූනි | පත්‍රිකා ඉදිරිපත් කිරීම:<br>"විවෘත හා දුරස්ථ පශ්චාද් උපාධි ශිෂ්‍යයින් අතර ශාස්ත්‍රීය ජයග්‍රහණ පහසු කිරීම පිණිස, අන්තර්ජාල අවකාශයක් උපයෝගී කරගැනීම පිළිබඳ සහභාගිවන අයගේ අදහස් "<br>වාර්ෂික ජාතික SLAIHEE සමුළුව | උසස් අධ්‍යාපන කාර්යක්ෂමතාව වැඩිදියුණුකිරීම සඳහා වන ශ්‍රී ලංකා සංගමය<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (2017) |
| 2017 ජූලි | සමඉදිරිපත් කරන්නා (ප්‍රධාන කතෘ) "අදෘශ්‍ය" සිසුන් දායක කරගැනීම : දුරස්ථ ඉගැන්වීම තුල දේශීය සහ ජාත්‍යන්තර සහයෝගීතාවයේ බලය (ICOIE 2017) | විවෘත හා නවෝත්පාදක අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICOIE 2017), හොංකොං විවෘත විශ්වවිද්‍යාලය (2017 ජූලි) |
| 2017 අගෝස්තු | ඉදිරිපත් කරන්නා - පන්ති කාමර විෂය නිර්දේශ සහ ක්‍රියාකාරකම් පිළිබඳ සැසිය: මිශ්‍රිත පන්ති කාමරවල සහයෝගී ඉගෙනීම, බහු ආකෘතිකතාව, මිශ්‍රිත උපදෙස්<br>සියලුම ADE/DDE යේ ජාතික මට්ටමේ සමුළුව සඳහා වන වැඩමුළුව (ඉංග්‍රීසි) | භාෂා අධ්‍යයනාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව |
| 2017 සැප්තැම්බර් | ඉදිරිපත් කරන්නා - Panel " දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පර්යේෂණ සිදු කිරීම"<br>IRELS 2017<br>සැසිවාර සභාපති | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩලය වෙනුවෙන් පවත්වන ලද වැඩසටහන් සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ඉගැන්වීම්, ඇගයීම් හා සම්බන්ධීකරණ සහාය ලබා දෙන ලදී. එම කාර්යමණ්ඩලය විසින්විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය සහ අධ්‍යාපන පීඨය හා කොළඹ, කැලණිය, ශ්‍රී ජයවර්ධනපුර හා යාපනය විශ්වවිද්‍යාලයන්හි ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශයන් වෙත ඉගැන්වීම්, ඇගයීම්, අධීක්ෂණ සහ පරීක්ෂණ සහාය ද ලබා දෙන ලදී.පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ජාතික විශ්වවිද්‍යාල ගණනාවක සම්මන්ත්‍රණ සහ සමුළු වැඩ සඳහා ද සහාය පළ කරන ලදී. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ විශේෂඥ දැනුම මඟින්ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉංග්‍රීසි භාෂා හා විදේශ භාෂා අධ්‍යයනාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ද්විභාෂා ඒකකය ද ප්‍රතිලාභ අත්කර ගන්නා ලදී. මෙම ඉගැන්වීම් ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට අමතරව, ශ්‍රී ලාංකේය අධ්‍යයනය සඳහා වන ඇමෙරිකානු ආයතනය සමඟ ද ක්‍රියාකාරකම් ගණනාවක් සම්බන්ධයෙන් සහයෝගීව කටයුතු කරන ලද අතර, ඊට ආරාධිත ඇමෙරිකානු ජාතික විද්වතෙකු විසින් පවත්වන ලද වැඩමුළුවක් මෙන්ම ජාත්‍යන්තර විද්වත් සමුළු දෙකක් ද ඇතුලත් විය.

විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයන අධ්‍යයනාංශයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් සිය කායර්යන්හි විවිධ අංශ සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත දිගින් දිගටම සහාය පළ කරන ලදී. මෙම සහාය නොමැතිව ශාස්ත්‍රපති උපාධි මට්ටමේ පර්යේෂණ අධීක්ෂණය සිදු කළ නොහැකි වනු අතර, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයන අධ්‍යයනාංශයේ කාර්යමණ්ඩලය විසින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශාස්ත්‍රීය හා පර්යේෂණ කාර්යයන් සඳහා ඕනෑම අවස්ථාවකදී උනන්දුවෙන් සහාය ලබා දෙනු ලැබ ඇත.

2017 වර්ෂය පුරාවටම, විවෘත විශ්වවිද්‍යාලයේ උපකුලපති, එහි පීඨ සභාවේ සාමාජිකයින්, නියෝජ්‍ය උපකුලපති, ලේඛකාධිකාරි, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා හා අධ්‍යාපන පීඨවල පීඨාධිපත්වරුන්, මූල්‍යාධිකාරී, පුස්තකාලයාධිපති හා පුස්තකාල කාර්යමණ්ඩලය, අධ්‍යාපන පීඨයේ සහකාර ලේඛකාධිකාරිවරුන් සහ අධ්‍යාපනික තාක්ෂණවේද අංශයේ අධ්‍යයන කාර්යමණ්ඩලය ඇතුලු විවෘත විශ්වවිද්‍යාලයේ විවිධ පුද්ගලයින් සහ ඒකක විසින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත සහාය ලබා දෙන ලදී.

**2017 වර්ෂය තුල පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත සහාය දුන් ආරාධිත කාර්යමණ්ඩලය**

**(ශ්‍රී ලංකාවේ සෑම ජාතික විශ්වවිද්‍යාලයකින්ම පාහේ ලද ශාස්ත්‍රීය පුද්ගලයින්ගේ විශේෂඥ දැනුම මත ආකෂර්ණය කර ගත හැකි, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිදු කරන ලද ජාතික කාර්යයන් පිළිබඳව ද මෙම ලැයිස්තුවෙහි දැක්වේ.)**

<u>දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය</u>

| නම | අනුබද්ධිත ආයතනය |
|---|---|
| රුහානි පෙරේරා මිය | ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| සුනිලා ගලප්පත්ති මිය | සම්මානිත කතෘ, ලන්ඩන්හි පිහිටි රාජකීය ෂේක්ස්පියර් සමාගමේ **(Royal Shakespeare Company)** හිටපු නාට්‍ය උපදේශක |
| නදීන් වන්නියසිංහම් මිය | වාර්ගික අධ්‍යයනයන් සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය |
| මාණික්‍යා කොඩිතුවක්කු මිය | භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය, විවෘත විශ්වවිද්‍යාලය |
| ආචාර්ය ප්‍රභා මනුරත්න | ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| ආචාර්ය ශශිකලා අස්සැල්ල | ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| ඇන්ඩි ෂූබර්ට් මයා | සමාජ විද්‍යාඥයින්ගේ සංගමය |
| ඇන්මරී ද සිල්වා මිය | වාර්ගික අධ්‍යයනයන් සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය |
| ආරියවංශ රණවීර මයා | සම්මානිත නවකථාකරු හා භාෂා පරිවර්තක සහ කැලණිය විශ්වවිද්‍යාලයේ ආරාධිත දේශක |
| ලාල් මැදවත්තේගෙදර මයා | භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය, විවෘත විශ්වවිද්‍යාලය |
| මධුභාෂිණී රත්නායක මිය | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| ආචාර්ය අමරකීර්ති ලියනගේ | සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| ආචාර්ය චිත්‍රා ජයතිලක | ඉංග්‍රීසි අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| අක්රි අමීර් මහතා | නාට්‍යවේදී හා කථන හා නාට්‍ය ගුරු |
| කෞෂල්‍යා ප්‍රනාන්දු මිය | සම්මානිත නාට්‍යවේදිනී |
| ආචාර්ය දිනාලි දේවේන්ද්‍ර | භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| දිනාලි ප්‍රනාන්දු මිය | ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| ආචාර්ය විවීමරී වැන්ඩපදූටර්න් | භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| පාවර්තී නාගසුන්දරම් මිය | ගුරු අධ්‍යාපනඥ - පෙර ජාතික අධ්‍යාපන ආයතනය |
| මහාචාර්ය රිහානා රහීම් | භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| ආචාර්ය හේමමාලා රත්වත්තේ | භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය නිලූෆර් ද මෙල් | ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| ආචාර්ය ප්‍රදීප් පීරිස් | දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| ආචාර්ය වගීෂා ගුණසේකර | ශ්‍රී ලාංකේය අධ්‍යයනය සඳහා වන ඇමෙරිකානු ආයතනය |
| ආචාර්ය කෞෂල්‍යා පෙරේරා | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |

දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

| ආයතනය | අනුබද්ධිත ආයතනය |
|---|---|
| ඩී. ප්‍රනාන්දු මිය | ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| ආචාර්ය එච්. වී. එම්. රත්වත්තේ | භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| ආචාර්ය පී. පීරිස් | දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| ආචාර්ය ඩී. ඊ. දේවේන්ද්‍ර | භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| ආචාර්ය ඩබ්ලිව්. සෙනෙවිරත්න | පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| ආචාර්ය රාධිකා ද සිල්වා | භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| එස්. ගුණවර්ධන මයා | භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය, මොරටුව විශ්වවිද්‍යාලය |
| ආචාර්ය ඒ. අබේසේකර | පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| ආචාර්ය කේ. පෙරේරා | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය සී. ගුණවර්ධන | අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| ටී. අයි. වික්‍රමාරච්චි මයා | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය මහේෂ්වර කුරුක්කල් සරවන පවායියර් | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ මධ්‍යස්ථානය (ELTC), යාපනය විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය රිහානා රහීම් | භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| ආචාර්ය පාලිත දිසානායක | කැලණිය විශ්වවිද්‍යාලය |
| මහීෂි රණවීර මිය | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| නදීන් වන්නෙසිංහම් මිය | වාර්ගික අධ්‍යයනය සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය |
| ශිවානී ඉලංගකෝන් මිය | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය දුෂ්‍යන්ති මෙන්ඩිස් | ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| එතෙල් නානායක්කාර මිය | පරීක්ෂණ හා ඇගයීම් විශේෂඥ, ජාතික අධ්‍යාපන ආයතනයේ සහ විභාග දෙපාර්තමේන්තුවේ උපදේශක |
| ආචාර්ය රොමෝලා රසූල් | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| ආචාර්ය විවීමරී වැන්ඩපර්ට්ටර්න් | භාෂා අධ්‍යයන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| රංජිත් පෙරේරා මයා | විශ්‍රාමික පාසල් විදුහල්පති |
| මහාචාර්ය ශිරෝමි ප්‍රනාන්දු | ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| දිලිණි වලිසුන්දර මිය | ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| ආචාර්ය චිත්‍රා ජයතිලක | ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| සුමුදු ඇඹෝගම මිය | සෞන්දර්ය හා කලා විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය දිල්රුක්ෂි සේනාරත්න | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| කසුන් වින්දික මයා | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය, මහනුවර |
| කේතකී නාගහවත්ත මිය | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ හා වෙනත් ජාතික විශ්වවිද්‍යාලවල අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය විසින් ලබා දෙන ලද සහාය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් කෘතඥපූර්වකව අගයනු ලබයි. ඊට අතිරේකව, විශ්වවිද්‍යාල පද්ධතියෙන් බැහැර වෘත්තිකයින් ගණනාවක් විසින් ආයතනික පාඨමාලා හා වැඩසටහන් ප්‍රදානය කිරීම සඳහා ලබා දුන් සහාය ද පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් අගයනු ලැබේ. මෙම සහාය නොවන්නට, මෙම ආයතනයට ක්‍රියාකාරී වීමට නොහැකි වනු ඇත. විවිධාකාර වූ මෙන්ම ව්‍යාප්තවන සිය සේවාදායකයින් වෙත උසස් ගුණාත්මක සේවාවක් ලබා දීමට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකිවීම ද මෙම සහාය මඟින් තහවුරු කෙරේ.

## 4. සංශෝධිත මූල්‍ය ප්‍රකාශන (නව ආකෘතියට අනුව)

(අ) උපචිත වියදම් පිළිබඳ විස්තර

| විෂයය | 2016 රු. | 2017 රු. |
|---|---|---|
| අ. පෞද්ගලික දීමනා | 12,660,591.00 | 15,416,958.00 |
| ආ. ප්‍රවාහන | 70,314.00 | 94,331.00 |
| ඇ. සැපයුම් | 787,34500 | 974,909.00 |
| ඈ. නඩත්තු | 156,94400 | 260,348.00 |
| ඉ. කොන්ත්‍රාත් සේවා | 854,828.00 | 1,454,608.00 |
| ඊ. වෙනත් | 2,273,112.00 | 4,880,962.00 |
| මුළු වියදම | 16,803,134.00 | 23,082,116.00 |

(ආ) ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂයය | 2016 රු. | 2017 රු. |
|---|---|---|
| අ. ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ අත්පත්කරගැනීම | 2,153,746.00 | 4,565,245.00 |
| ආ. යන්ත්‍රෝපකරණ අත්පත්කරගැනීම | - | 7,878,631.00 |
| ඇ. පුස්තකාල පොත් අත්පත්කරගැනීම | 87,347.00 | 211,280.00 |
| ඈ. ගොඩනැගිලි හා සැකසුම් අත්පත්කරගැනීම | 46,346,778.00 | 1,190,330.00 |
| ඉ. වෙනත් | - | 5,661,631.00 |
| මුළු වියදම | 48,587,871.00 | 19,507,117.00 |

(ඇ) මූල්‍ය ප්‍රගතියේ තොරතුරු (වියදම්)

| විෂයය | 2017 දී ප්‍රතිපාදන රු. | 2017 දී වියදම රු. | ඉතුරුම්/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. ව්‍යාපෘති හැර උපචිත | 20,468,000.00 | 19,545,692.00 | 922,308.00 |
| ආ. ව්‍යාපෘති හැර ප්‍රාග්ධන | 5,700,000.00 | 5,625,000.00 | 75,000.00 |
| ඇ. දේශීය අරමුදල් සපයන ලද ව්‍යාපෘති | | | |
| ඈ. විදේශීය අරමුදල් සපයන ලද ව්‍යාපෘති | | | |
| මුළු වියදම | 26,168,000.00 | 25,170,692.00 | (997,308) |

(ඈ) මූල්‍ය ප්‍රගතියේ තොරතුරු (උපයන ලද ආදායම)

| ආදායම් මූලාශ්‍රය | 2017 දී ප්‍රතිපාදන රු. | 2017 දී එකතුකිරීම් | හිඟය/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. උපාධි අධ්‍යයන | | | |
| ආ. පශ්චාද් උපාධි අධ්‍යයන | **7,900,000.00** | **12,959,029.00** | **5,059,029.00** |
| ඇ. උපදේශන | | | |
| ඈ. වෙනත් | | | |
| මුළු ආදායම | **7,900,000.00** | **12,959,029.00** | **5,059,029.00** |

(ඉ) මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

| විෂයය | සූත්‍රය | ශිෂ්‍යයෙකු සඳහා වන වියදම රු. |
|---|---|---|
| අ. ශිෂ්‍යයෙකු සඳහා වන උපචිත වියදම (RE) | උපචිත වියදම/ශිෂ්‍ය සංඛ්‍යාව | **89,120.14** |
| ආ. ශිෂ්‍යයෙකු සඳහා වන ප්‍රාග්ධන වියදම (CE) | ප්‍රාග්ධන වියදම/ශිෂ්‍ය සංඛ්‍යාව | **75,317.05** |
| මුළු වියදම | | **164,437.19** |

## 5. විගණන කමිටුවේ වාර්තාව

<u>අභ්‍යන්තර විගණන වාර්තාව - 2017</u>

සමාලෝචනයට යටත් වර්ෂය තුල පහත සඳහන් සුවිශේෂී නියුතුවීම් ආවරණය කරමින්, අභ්‍යන්තර විගණන කමිටුව විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඉලක්කගත ක්ෂේත්‍රයන්හි සිය විගණන කාර්යයන් සිදු කරන ලදී.

1. <u>පූර්ව විගණන</u>
    - විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (UPF) නිදහස් කිරීම.
    - පාරිතෝෂිත ගෙවීම.
    - විශ්‍රාම වැටුප් අරමුදල නිදහස් කිරීම.
    - කොන්ත්‍රාත්තු පිළිබඳ අවසන් ගෙවීම් සහ රඳවාගැනීම් නිදහස් කිරීම.

2. <u>අනාවරණය කරගත් කරුණු පිළිබඳ විගණන</u>

    - OUSL/IA/AR/2017/PGIE/01- අයවැය පාලනය සඳහා විගණන වාර්තාව - පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
    - OUSL/IA/AR/2017/PGIE/02- භාණ්ඩ සමීක්ෂණයේ විගණන වාර්තාව - 2016

3. <u>විගණන කමිටුව</u>

    පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ විගණන කමිටුව විසින් ආයතනයේ කටයුතු සමාලෝචනය කිරීම සඳහා අවම වශයෙන් මාස දෙකකට වරක් හෝ නිතිපතා මුණගැසෙනු ලැබේ. විගණකාධිපතිවරයා සහ අභ්‍යන්තර විගණනය විසින් එවන ලද විගණන වාර්තා හා විමසුම් සහ ඊට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ලබා දී ඇති ප්‍රතිචාර කමිටුව විසින් සලකා බලනු ලැබේ. නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ද අධීක්ෂණය කෙරෙනු ලැබෙන පරිදි කමිටුව විසින් නිර්දේශ සහ නියෝග ලබා දෙනු ලැබේ.

    සමාලෝචනයට යටත් මෙම වර්ෂය තුල (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ විගණන කමිටු රැස්වීම් හැර) විගණන කමිටුව විසින් අවස්ථා හතරක දී මුණගැසී ඇත.

4. <u>කාර්යමණ්ඩලය</u>

    අභ්‍යන්තර විගණන අංශය පහත සඳහන් කාර්යමණ්ඩලයෙන් සමන්විත වේ:
    - සහකාර අභ්‍යන්තර විගණකවරයෙකු.
    - විගණක සහකාරවරුන් දෙදෙනෙකු.
    - ලිපිකරුවෙකු.
    - පරිගණක යෙදවුම් සහකාරවරයෙකු.
    - කම්කරුවෙකු.

## 6. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනය

**2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව**

| වත්කම් | | 2017 | 2016 |
|---|---|---|---|
| | | (රු.) | (රු.) |
| ජංගම වත්කම් | සටහන් | | |
| බැංකුවේ මුදල් | 1 | 11,420,362 | 18,385,728 |
| කාර්යමණ්ඩලය සඳහා ණය සහ අත්තිකාරම් | 2 | 1,216,377 | 973,328 |
| සිසුන්ගෙන් ලැබිය යුතු | 3 | 5,065,653 | 3,114,832 |
| කෙටි කාලීන ආයෝජන | 4 | 46,761,464 | 43,000,000 |
| භාණ්ඩ ලේඛන | | 313,296 | 96,872 |
| පූර්ව ගෙවීම් සහ ලැබිය යුතු | 5 | 36,146 | 23,770 |
| | | 64,813,298 | 65,594,531 |
| | | ======== | ======== |
| ජංගම නොවන වත්කම් | 6 | | |
| ලී බඩු සහ උපාංග | | 3,134,436 | 2,028,688 |
| කාර්යාල උපකරණ | | 2,294,815 | 1,636,809 |
| පුස්තකාල පොත් සහ කාලීන සඟරා | | 593,704 | 610,501 |
| පරිගණක හා උපාංග | | 5,614,329 | 426,753 |
| පාපැදිය | | 4,000 | 2,228 |
| උපාධි ලෝගු | | 5,512 | 9,712 |
| වෙනත් වත්කම් | | 30,348 | 20,762 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | 7,740,678 | - |
| ඉඩම | | - | 22,581,550 |
| ගොඩනැගිල්ල | | 84,804,933 | 88,061,165 |
| අස්පෘශ්‍ය වත්කම් | 7 | 482,992 | - |
| | | 104,705,747 | 115,378,168 |
| මුළු වත්කම් | | 169,519,045 | 180,972,699 |
| | | ========= | ========= |
| වගකීම් | | | |
| ජංගම වගකීම් | | | |
| උපචිත වියදම් | 8 | 1,532,306 | 1,262,751 |
| සුළු ණයහිමියන් | 9 | 2,875,061 | 55,290 |
| කලින් ලද ශිෂ්‍ය ගාස්තු | 10 | 3,786,136 | 2,310,584 |
| ඉදි කිරීම් මත රඳවා තබා ගැනීම් | | 2,011,359 | 2,011,358 |
| අත්තිකාරම්හි පොලිය | | 288,404 | 462,672 |
| | | 10,493,265 | 6,103,285 |
| | | ======== | ======== |

| | | | |
|---|---|---|---|
| ජංගම නොවන වගකීම් | | | |
| පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | 11 | 1,703,630 | 1,157,113 |
| මුළු වගකීම් | | 12,196,895 | 7,260,398 |
| දළ වත්කම් | | 157,322,150<br>========= | 173,712,300<br>========= |
| දළ වත්කම්/මුදල් සමානයන් | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් වූ | 12 | 107,543,180 | 92,911,2150 |
| ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් නොවූ | 13 | 17,189,312 | 35,829,434 |
| ඉඩම් තක්සේරුකරණ සංචිතය | | - | 22,500,000 |
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන සංවර්ධන අරමුදල | | 3,967,500 | 3,967,500 |
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන සාමාන්‍ය සංචිතය | | 28,622,158 | 18,504,151 |
| මුළු දළ වත්කම්/මුදල් සමානයන් | | 157,322,150<br>========= | 173,712,300<br>========= |

**පිටු අංක 5 සිට 7 දක්වා සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 8 සිට 16 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යන්ත කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ සම්පාදනය කිරීමෙහි සහ ඉදිරිපත් කිරීමෙහි ලා කළමනාකරණ මණ්ඩලය වග කියනු ලබයි. එම මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කරන ලද අතර, මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබා ඇත.**

| | | | | |
|---|---|---|---|---|
| ආචාර්ය එච්.එස්.රඹුක්වැල්ල | කළමනාකරණ මණ්ඩල | කළමනාකරණ මණ්ඩල | ඩබ්.ඩී.ටී.තිලකරත්න මහතා | එස්.එම්.පී.ඒ.සුභානි මහත්මිය |
| අධ්‍යක්ෂ | සාමාජික | සාමාජික | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | නියෝජ්‍ය මූල්‍යාධිකාරි |

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|
| ආදායම | සටහන | | |
| රජයේ උපචිත ප්‍රදාන | | 18,727,098 | 12,186,000 |
| අයදුම්පත්‍ර ගාස්තු | | 233,000 | 213,500 |
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | | 229,525 | 165,900 |
| පංති ගාස්තු | | 7,448,475 | 5,559,525 |
| විභාග ගාස්තු | | 365,790 | 134,810 |
| අතිරේක ගාස්තු | | 157,800 | 111,000 |
| නිබන්ධන ගාස්තු | | 1,376,039 | 812,288 |
| කළඹ ගාස්තු | | 72,000 | 120,000 |
| කෙටි පාඨමාලාවලින් ලද පංති ගාස්තු | | 3,076,400 | 414,521 |
| පොලී ආදායම | 14 | 4,611,991 | 3,431,844 |
| විවිධ ලැබීම් | | 170,560 | 1,500 |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | | 5,633,157 | 1,407,955 |
| මුළු ආදායම | | 42,101,836 | 24,558,842 |
| වියදම් | | | |
| පෞද්ගලික වැටුප් හා දීමනා | 15 | 15,416,958 | 12,660,591 |
| ගමන් වියදම් | 16 | 94,331 | 70,314 |
| සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය | 17 | 974,909 | 787,345 |
| නඩත්තු වියදම් | 18 | 260,348 | 156,944 |
| කොන්ත්‍රාත් සේවා | 19 | 1,454,608 | 854,828 |
| වෙනත් උපචිත වියදම් | 20 | 4,880,962 | 2,273,112 |
| ක්ෂය වීම් | | 5,658,457 | 3,665,934 |
| පාරිතෝෂිත වියදම් | | 546,517 | 505,488 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | 107,008 | - |
| මානව ප්‍රාග්ධන වියදම් | | 168,000 | - |
| නැවත තක්සේරුකිරීමේ හිඟය | | 2,428,962 | - |
| මුළු වියදම් | | 31,991,061 | 20,974,556 |
| කාලසීමාව සඳහා අතිරික්තය/(හිඟය) | | 10,110,775 | 3,584,286 |

**පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය**

**2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා දළ වත්කම්/මුදල් සමානයන්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය**

(රු.)

| | පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සාමාන්‍ය සංචිතය | වෙනත් අරමුදල් | වැය වූ ප්‍රාග්ධන ප්‍රදාන | වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | 14,957,684 | 3,967,500 | 47,972,391 | 44,676,212 | 111,573,788 |
| | | | - | - | |
| පෙර වසරේ ක්ෂයවීම් ගැලපුම් | 16,225 | - | 46,346,778 | (46,346,778) | 16,225 |
| වසර තුල වැය වූ ප්‍රාග්ධන ප්‍රදාන | - | - | - | 37,500,000 | - |
| වසර තුල ලද අරමුදල් | - | - | - | - | 37,500,000 |
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඉඩමේ අගය | - | - | (1,407,955) | - | - |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | - | - | - | - | (1,407,955) |
| කාලසීමාව සඳහා අතිරික්තය/(හිඟය) | 3,530,242 | - | - | - | 3,530,242 |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | 18,504,151.00 | 3,967,500 | 92,911,215 | 35,829,434.34 | 151,212,300 |
| | ========== | ======= | ======== | ========= | ========== |
| පෙර වසරේ ගැලපුම් | 7,232 | - | - | - | 7,232 |
| වසර තුල වැය වූ ප්‍රාග්ධන ප්‍රදාන | - | - | 20,265,122 | (20,265,122) | - |
| වසර තුල ලද අරමුදල් | - | - | - | 1,625,000 | 1,625,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | - | - | (5,633,157) | - | (5,633,157) |
| කාලසීමාව සඳහා අතිරික්තය/(හිඟය) | 10,110,775 | - | - | - | 10,110,775 |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | 28,622,158 | 3,967,500 | 107,543,180 | 17,189,312 | 157,322,150 |
| | ========= | ======= | ======== | ======== | ========= |

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
## 2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ | | |
| සාමාන්‍ය කටයුතුවලින් ලද අතිරික්තය/(හිඟය) | 10,110,775 | 3,584,286 |
| කෙටි කාලීන ආයෝජනවලින් ලද පොලී ආදායම | (4,611,991) | (3,400,257) |
| මුදල් නොවන ප්‍රවාහ | | |
| ක්ෂයවීම් | 5,658,457 | 3,665,934 |
| පාරිතෝෂිත වියදම් | 546,517 | 505,488 |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (5,633,157) | - |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 107,008 | - |
| පූර්ව වසරේ ගැලපුම් | 7,232 | - |
| නැවත තක්සේරුකිරීමේ හිඟය | 2,428,962 | - |
| පූර්ව වසරේ ගැලපුම් - ක්ෂයවීම් | 75,116 | - |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට ප්‍රථම දළ අතිරික්තය | 8,688,919 | 2,947,496 |
| කාරක ප්‍රාග්ධනයේ (ඉහළ යාම)/පහළ යාම | | |
| භාණ්ඩ ලේඛනවල (ඉහළ යාම) /පහළ යාම | (216,424) | 155,763 |
| ගෙවිය යුතු ගෙවීම්වල ඉහළ යාම/ (පහළ යාම) | 4,389,980 | (875,042) |
| ලැබිය යුතු ආදායම්වල (ඉහළ යාම)/පහළ යාම | (1,963,197) | (929,027) |
| කායර් මණ්ඩලය වෙත ණය සහ අත්තිකාරම්හි (ඉහළයාම)/පහළ යාම | (243,049) | (120,714) |
| පාරිතෝෂිත ගෙවීම් | - | - |
| මෙහෙයුම් කටයුතුවලින් දළ මූල්‍ය ප්‍රවාහ | 10,656,228 | 1,178,476 |

| | | |
|---|---|---|
| <u>ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ</u> | | |
| දේපල, උපාංග සහ උපකරණ මිලදී ගැනීම | (19,295,842) | (1,950,493) |
| පොත් සහ කාලීන සඟරා මිලදී ගැනීම | (211,280) | (87,347) |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම | (590,000) | - |
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ගොඩනැගිලි ව්‍යාපෘතිය | - | (46,346,778) |
| ආයෝජනවලින් ලද පොලිය | 4,611,991 | 3,400,257 |
| කෙටි කාලීන ආයෝජන ආපසු ගැනීම් | 19,100,400 | 18,494,422 |
| නව කෙටි කාලීන ආයෝජන | <u>(22,861,864)</u> | <u>-</u> |
| ආයෝජන කටයුතුවලින් ලද දළ මුදල් ප්‍රවාහ | (19,246,595) | (26,489,939) |
| <u>මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ</u> | | |
| භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | <u>1,625,000</u> | <u>37,500,000</u> |
| මූල්‍ය කටයුතුවලින් ලද දළ මුදල් ප්‍රවාහ | <u>1,625,000</u> | <u>37,500,000</u> |
| මුදල් සහ මුදල් සමානයන්හි දළ ඉහළ යාම/ (පහළ යාම) | (6,965,366) | 15,532,749 |
| වසර මුලදී මුදල් සහ මුදල් සමානයන් | <u>18,385,728</u> | <u>2,852,979</u> |
| වසර අගදී මුදල් සහ මුදල් සමානයන් | 11,420,362<br>========== | 18,385,728<br>========== |

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2017

**සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**01.** වාර්තා කිරීමේ ආයතනය

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, 2005 අංක 04 දරන පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන ආඥාපනත යටතේ සංස්ථාපනය කරනු ලැබ ඇත. එය 2006 ඔක්තෝබර් මස 1වන දින දියත් කරන ලදී. වර්තමානයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පශ්චාද් උපාධි පාඨමාලා සහ කෙටි කාලීන පාඨමාලා පවත්වනු ලැබේ.

**02.** අනුගතවීමේ ප්‍රකාශය

ඓතිහාසික පිරිවැය සම්මුතියක් සහ උපචිත පදනමක් මත හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුගතව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සම්පාදනය කරනු ලැබ ඇත.

**03.** රජයේ ප්‍රදාන

මෙම වසර සඳහා ලද මුළු රජයේ ප්‍රදාන ප්‍රමාණය රු. 20,352,098 කි. රු.18,727,098ක් වන පුනරාවර්තන ප්‍රදාන, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ආදායම් ලෙස හඳුනාගනු ලැබ ඇත. ලද ප්‍රාග්ධන ප්‍රදාන, වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ගිණුම්ගත කරනු ලැබ ඇති අතර, වැය කළ ප්‍රමාණය, වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට මාරු කරන ලදී.

| | 2016 වසර තුල ලද මුදල් ප්‍රමාණය (රු.) | වැය නොකළ මුදල් ප්‍රමාණය (රු.) |
|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන | 18,727,098 | - |
| <u>ප්‍රාග්ධන ප්‍රදාන</u> | | |
| උපාංග, ලී බඩු, කාර්යාල උපකරණ සහ වෙනත් | 1,000,000 | 10,142,224 |
| පොත් සහ කාලීන සඟරා | - | 2,917,767 |
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ගොඩනැඟිලි ව්‍යාපෘතිය | - | 3,672,322 |
| මානව ප්‍රාග්ධනය | 425,000 | 257,000 |
| පුනරුත්ථාපන | 200,000 | 200,000 |
| | 20,352,098 | 17,189,312 |
| | ======== | ======== |

ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය

ප්‍රාග්ධන ප්‍රදාන සහ ලද වෙනත් ප්‍රදාන ප්‍රාග්ධනීකරණය කරන ලද අතර, ආශ්‍රිත වත්කම්හි ජීව කාලය මත ආදායම ලෙස ක්‍රමක්ෂය කරන ලදී.

**04.** දේපල, උපාංග සහ උපකරණ

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 ට අනුව, දේපල, උපාංග සහ උපකරණ ක්ෂය කිරීම සිදු කරනු ලැබ ඇත. එහෙයින්, වත්කමක් භාවිතය සඳහා ලබා ගත හැකි අවස්ථාවලදී, එම වත්කමේ ක්ෂය කිරීම සිදු කරනු ලබනු ඇත.

(ආ) වාර්ෂික ක්ෂය කිරීම් අනුපාත පහත පරිදි වේ:

- ලී බඩු සහ උපාංග 10%
- කාර්යාල උපකරණ 20%
- පරිගණක සහ උපාංග 20%
- පොත් සහ කාලීන සඟරා 20%
- යතුරුපැදිය 20%
- උපාධි ලෝගු 20%
- වෙනත් වත්කම් 20%
- පරිගණක මෘදුකාංග 20%
- ගොඩනැගිල්ල 5%

(ඇ) ජංගම නොවන වත්කම්හි ඇස්තමේන්තුගත ජීව කාලය මත, ක්ෂය වීම් ආදායම් ප්‍රකාශය සඳහා අය කෙරෙනු ලැබේ.

(ඈ) සමුච්චිත ක්ෂයවීම් අඩු කළ පිරිවැය තුල ජංගම නොවන වත්කම් පෙන්නුම් කෙරේ.

(ඉ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් මිලදී ගන්නා ලද පොත් සහ කාලීන සඟරා එම ආයතනයේ ශිෂ්‍යයින්ගේ ප්‍රතිලාභය උදෙසා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය වෙත යවනු ලැබ ඇත.

(ඊ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ගොඩනැගිල්ල ඉදිකර ඇති ඉඩමේ අයිතිය එම ආයතනය වෙත නීත්‍යානුකූලව පවරා නොමැත්තේ, විවෘත විශ්වවිද්‍යාලයේ අනුබද්ධිත ආයතනයක් ලෙස මෙම ආයතනය ක්‍රියාත්මක වන හෙයින් සහ එම ඉඩම සිය භාරයට ගැනීම පිණිස, ආයතනයේ ආඥාපනතේ නීතිමය විධිවිධාන නොපවතින හෙයිනි. එසේ වුවද, තක්සේරුකරණ දෙපාර්තමේන්තුව විසින් රු. 22,500.00/- ලෙස තක්සේරු කරනු ලැබ ඇති පර්චස් 15ක ඉඩම, 2016 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන තුල පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වත්කමක් ලෙස වාතර්‍ා කර තිබේ. 2017 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන තුල, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07ට අනුගතව ඉඩමේ වටිනාකම රු. 22,500,000.00 ලෙස අනාවරණය කිරීමට තීරණය කරනු ලැබ ඇත.

(උ) ගෘහභාණ්ඩ සහ උපාංග, කාර්යාල උපකරණ, පරිගණක හා උපාංග සහ පාපැදිය 2017.01.01 දිනට නැවත තක්සේරු කරනු ලැබ ඇති අතර, එම නැවත තක්සේරු කරන ලද අගයන් ගිණුම්ගත කරනු ලැබ ඇත.

**05.** කෙටිකාලීන ආයෝජන

හදිසි අවශ්‍යතා සඳහා අවශ්‍ය නොවන මුදල්, මහජන බැංකුවේ කෙටි කාලීන ස්ථාවර තැන්පතුවල සහ බැංකු කටයුතුවල (TB) ආයෝජනය කරන ලදී. වසර අවසානයේ කල් පිරුණු පොලී ආදායම ඇතුලත්ව ආයෝජනයේ ශුද්ධ වටිනාකම ගණනය කරනු ලැබ ඇත.

**06.** තොග තක්සේරු කිරීම

**First in First out (FIFO)** පදනම භාවිත කරමින්, ගබඩාවල පවතින තොගවල වටිනාකම ගණනය කරනු ලැබ ඇත.

**07.** වගකීම්

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, දත් සියලුම වගකීම් සැලකිල්ලට ගනු ලැබ ඇත.

**08.** බැංකුවේ පවත්නා මුදල්

ජංගම ගිණුම් අංක **174100246838310** හා **174336838310** හා සම්බන්ධ කරන ලද ඉතුරුම් ගිණුම් දෙකක් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් විවෘත කරන ලදී. මුළු වසර පුරාම රු.**100,000/-** ක ශේෂයක් මෙම ජංගම ගිණුම්වල පවත්වාගෙන යන ලදී.

**09.** අස්පෘශ්‍ය වත්කම්

මිලදී ගත් පරිගණක මෘදුකාංග, පිරිවැය අඩු කරන ලද උපචිත ක්‍රමක්ෂය ලෙස සඳහන් වේ.

**10.** ප්‍රතිපාදන

එක් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සේවකයින් සම්බන්ධයෙන් පාරිතෝෂිත ප්‍රතිපාදන ගණනය කරනු ලැබ ඇත. කෙසේ වුවද, විශ්වවිද්‍යාල පද්ධතිය තුල වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයින් හට විශ්‍රාම ගැනීමේදී පාරිතෝෂිත ලබා ගැනීමට හිමිකම ලැබේ.

**11.** ආදායම් හඳුනාගැනීම

රජයේ ප්‍රදාන සහ අභ්‍යන්තර මූලාශ්‍ර මඟින් ජනනය වූ ආදායමින් ආදායම සමන්විත වේ. ආයෝජන මත පොලිය උපචිත පදනමක් මත ගිණුම්ගත කරනු ලබයි.

**12.** වියදම් හඳුනාගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද මාර්ගෝපදේශ සහ පොදු වාර්තා කිරීමේ පද්ධති ආකෘතිය මත පදනම්ව, වියදම විශ්ලේෂණය කර, වැය ශීර්ෂවලට වර්ගීකරණය කරනු ලැබ ඇත.

**13.** බදුකරණය

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ලාභාංශවලින් ලද ලාභ සහ ආදායම හැර ලාභ සහ ආදායම, **2006** අංක **10** දරන දේශීය ආදායම් පනත යටතේ ආදායම් බදුවලින් නිදහස් වේ.

**14.** මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

"සෘජු නොවන ක්‍රමවේදය" භාවිත කරමින්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් **2 (SLPSAS 2)** හා අනුගතව මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත.

සටහන - 01

| බැංකු මුදල් | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| මහජන බැංකු ගිණුම් අංක 174100 156 838310 | 252,645 | 418,679 |
| මහජන බැංකු ගිණුම් අංක 174100 246 838310 | (902,000) | 3,960,318 |
| මහජන බැංකු ගිණුම් අංක 174100 336 838310 | 123,950 | 14,006,732 |
| මහජන බැංකු ගිණුම් අංක 174200 226 838310 | 9,941,809 | - |
| මහජන බැංකු ගිණුම් අංක 174200 136 838310 | 2,003,958 | - |
| | 18,385,729 | 18,385,728 |

සටහන - 02

| කාර්යමණ්ඩලය සඳහා ණය සහ අත්තිකාරම් | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| ආපදා ණය | 1,182,477 | 896,628 |
| රථවාහන ණය | 30,900 | 70,900 |
| විශේෂ අත්තිකාරම් | 500 | 500 |
| උත්සව අත්තිකාරම් | 2,500 | 5,300 |
| | 1,216,377 | 973,328 |

සටහන - 03

| ශිෂ්‍යයින්ගෙන් ලැබීමට නියමිත ආදායම් | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| ලැබීමට නියමිත කළඹ ගාස්තු | 72,000 | 72,000 |
| ලැබීමට නියමිත පංති ගාස්තු - TESL | 3,558,275 | 2,484,025 |
| ලැබීමට නියමිත පංති ගාස්තු - TLSC | 674,400 | 286,500 |
| ලැබීමට නියමිත නිබන්ධන ගාස්තු TESL | 541,918 | 259,827 |
| ලැබීමට නියමිත නිබන්ධන ගාස්තු TLSC | 70,200 | - |
| ලැබීමට නියමිත විභාග ගාස්තු TESL | 120,000 | - |
| ලැබීමට නියමිත විභාග ගාස්තු TLSC | 28,860 | 12,480 |
| | 5,065,653 | 3,114,832 |

සටහන - 04

| කෙටි කාලීන ආයෝජන | 2017<br>(රු.) | 2016<br>(රු.) |
|---|---|---|
| ආරම්භක ශේෂය | 43,000,000 | 61,494,422 |
| වසර තුල ආපසු ගැනීම් - ස්ථාවර තැන්පතු | - | (7,718,522) |
| වසර තුල ආපසු ගැනීම් - බැංකු ගණුදෙණු | (19,100,400) | (10,775,900) |
| නව ආයෝජන - බැංකු ගණුදෙණු | 22,861,864 | - |
| | 46,761,464 | 43,000,000 |
| | ========= | ======== |

සටහන - 05

| පූවර් ගෙවීම් සහ ලැබිය යුතු | 2017<br>(රු.) | 2016<br>(රු.) |
|---|---|---|
| පූර්ව ගෙවීම් | 36,146 | 23,770 |
| | 36,146 | 23,770 |
| | ===== | ===== |

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සඳහා සටහන්

### සටහන - 06

ජංගම නොවන වත්කම්

| | ලී බඩු සහ උපාංග | කාර්යාල උපකරණ | පරිගණක සහ උපාංග | පුස්තකාල පොත් සහ කාලීන සඟරා | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | පාපැදිය | උපාධි ලෝගු | වෙනත් වත්කම් | ඉඩම සහ ගොඩනැගිලි | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| <u>පිරිවැය</u> | | | | | | | | | | |
| **2017-01-01** දිනට ශේෂය | **2,500,288** | **3,721,463** | **2,113,051** | **2,570,953** | - | **10,700** | **21,000** | **46,607** | **90,400,694** | **101,384,755** |
| (+)වසර තුල මිලදී ගැනීම් | **2,537,671** | **2,027,574** | **5,640,786** | **211,280** | **7,878,631** | - | - | **20,850** | **1,190,330** | **19,507,122** |
| (-) නැවත තක්සේරු කිරීමට මාරු කිරීම | **(2,500,288)** | **(3,721,463)** | **(2,113,051)** | - | - | **(10,700)** | - | - | - | - |
| (-) වසර තුල බැහැර කිරීම් | - | | | | | | | | | |
| **2017-12-31** දිනට ශේෂය | **2,537,671** | **2,027,574** | **5,640,786** | **2,782,233** | **7,878,631** | - | **21,000** | **67,457** | **91,591,024** | **112,546,376** |
| <u>ක්ෂයවීම්</u> | | | | | | | | | | |
| **2017-01-01** දිනට ශේෂය | **471,600** | **2,084,653** | **1,686,299** | **1,960,453** | - | **8,472** | **11,288** | **25,845** | **2,257,978** | **8,506,587** |
| (+)ගැලපුම් | | **75,116** | - | - | | | | | | **75,116** |
| (+) වසර තුල ක්ෂය කිරීම් | **141,326** | **218,240** | **153,217** | **228,077** | **137,953** | - | **4,200** | **11,263** | **4,528,112** | **5,422,387** |
| (-) නැවත තක්සේරු කිරීමට මාරු කිරීම | **(471,600)** | **(2,159,769)** | **(1,686,299)** | - | - | **(8,472)** | - | - | - | **(4,326,140)** |
| **2017-12-31** දිනට ශේෂය | **141,325** | **218,240** | **153,217** | **2,188,529** | **137,953** | - | **15,488** | **37,108** | **6,786,090** | **9,677,951** |
| **2016-01-01** දිනට පොත්වල සටහන් කරන ලද දල අගය | **2,028,688** | **1,636,809** | **426,753** | **610,501** | - | **2,228** | **9,712** | **20,762** | **88,142,715** | **92,878,168** |
| **2016-12-31** දිනට පොත්වල සටහන් කරන ලද දල අගය | **2,396,346** | **1,809,335** | **5,487,569** | **593,704** | **7,740,678** | - | **5,512** | **30,348** | **84,804,933** | **102,868,425** |

| | ලී බඩු සහ උපාංග | කාර්යාල උපකරණ | පරිගණක සහ උපාංග | පාපැදිය | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| <u>නැවත තක්සේරු කිරීම</u> | | | | | |
| **2017-01-01 දිනට ශේෂය** | **820,100** | **606,850** | **158,450** | **5,000** | **1,590,400** |
| **(+)වසර තුල මිලදී ගැනීම්** | - | - | - | - | - |
| **2017-12-31 දිනට ශේෂය** | **820,100**<br>====== | **606,850**<br>====== | **158,450**<br>====== | **5,000**<br>===== | **1,590,400**<br>======= |
| <u>ක්ෂය වීම්</u> | | | | | |
| **2017-01-01 දිනට ශේෂය** | - | - | - | - | - |
| **(+)වසර සඳහා ක්ෂය කිරීම්** | **82,010** | **121,370** | **31,690** | **1,000** | **236,070** |
| **(-)වසර තුල බැහැර කිරීම්** | - | - | - | - | - |
| **2017-12-31 දිනට ශේෂය** | **82,010**<br>===== | **121,370**<br>====== | **31,690**<br>===== | **1,000**<br>===== | **236,070**<br>====== |
| **2017-01-01 දිනට පොත්වල සටහන් කරන ලද දල අගය** | **820,100** | **606,850** | **158,450** | **5,000** | **1,590,400** |
| **2017-12-31 දිනට පොත්වල සටහන් කරන ලද දල අගය** | **738,090** | **485,480** | **126,760** | **4,000** | **1,354,330** |

සටහන - 07

| <u>අස්පෘශ්‍ය වත්කම්</u> | <u>2017</u><br><u>(රු.)</u> | <u>2016</u><br><u>(රු.)</u> |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | 590,000 | - |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය | <u>107,008</u> | <u>-</u> |
| | 482,992 | - |
| | ====== | === |

සටහන - 08

| <u>උපචිත වියදම්</u> | <u>2017</u><br><u>(රු.)</u> | <u>2016</u><br><u>(රු.)</u> |
|---|---|---|
| 2015 වර්ෂය සඳහා විගණන ගාස්තු | 125,000 | 125,000 |
| 2014 වර්ෂය සඳහා විගණන ගාස්තු | 150,000 | 150,000 |
| 2016 වර්ෂය සඳහා විගණන ගාස්තු | 140,000 | 140,000 |
| 2017 වර්ෂය සඳහා විගණන ගාස්තු | 150,000 | - |
| විදුලි සංදේශ වියදම් | 18,220 | 22,478 |
| අතිකාල ගාස්තු | 25,125 | 20,957 |
| බාහිර කථිකාචාර්ය ගාස්තු | 15,000 | 22,500 |
| විනෝදාස්වාද වියදම් | 9,491 | - |
| මුද්දර ගාස්තු සහ උපයන විට ගෙවීම් බදු | 2,175 | 1,775 |
| ගෙවිය යුතු පාරිතෝෂිත | 383,670 | 383,670 |
| වෙනත් ගෙවිය යුතු | 113,045 | 50,000 |
| ආරක්ෂක සේවා | 44,563 | 192,034 |
| පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කථිකාචාර්ය ගාස්තු | 290,000 | 22,500 |
| පිරිසිදු කිරීමේ සේවා | <u>66,018</u> | <u>131,837</u> |
| | 1,532,306 | 1,262,751 |
| | ======= | ====== |

සටහන - 09

| <u>සුළු ණයහිමියන්</u> | <u>2017</u><br><u>(රු.)</u> | <u>2016</u><br><u>(රු.)</u> |
|---|---|---|
| විවෘත විශ්වවිද්‍යාලය වෙත ගෙවිය යුතු | 92,317 | 40,128 |
| සොෆ්ට්ලොජික් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස් | 15,792 | 15,792 |
| හේලීස් ඉන්ඩස්ට්‍රියල් | 344,883 | - |
| මෙට්‍රොපොලිටන් ඉංජිනියරින් | 2,412,700 | - |
| ලීමා ක්‍රියේෂන්ස් | 2,565 | - |
| එක්ස්පොග්‍රැෆික්ස් (පෞද්ගලික) සමාගම | <u>6,804</u> | <u>-</u> |
| | 2,875,061 | 55,920 |
| | ====== | ====== |

සටහන - 10

| <u>කලින් ලද ශිෂ්‍ය ගාස්තු</u> | <u>2017</u><br><u>(රු.)</u> | <u>2016</u><br><u>(රු.)</u> |
|---|---|---|
| කලින් ලද පංති ගාස්තු TESL | 2,479,925 | 1,930,200 |
| කලින් ලද පංති ගාස්තු TLSC | 1,021,800 | - |
| කලින් ලද නිබන්ධන ගාස්තු | 4,111 | 150,059 |
| කලින් ලද ලියාපදිංචි ගාස්තු TESL | 140,550 | 119,475 |
| කලින් ලද ලියාපදිංචි ගාස්තු TLSC | 28,300 | 6,400 |
| කලින් ලද අතිරේක ගාස්තු TESL | 90,450 | 79,650 |
| කලින් ලද අතිරේක ගාස්තු TLSC | 21,000 | 4,800 |
| කලින් ලද කෙටි පාඨමාලා ගාස්තු | - | 20,000 |
| | 3,786,136<br>======= | 2,310,584<br>======= |

සටහන - 11

| <u>පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන</u> | <u>2017</u><br><u>(රු.)</u> | <u>2016</u><br><u>(රු.)</u> |
|---|---|---|
| ආරම්භක ශේෂය | 1,157,113 | 651,625 |
| වසර තුල පාරිතෝෂිත ගෙවීම් | - | - |
| වසර සඳහා ප්‍රතිපාදන | <u>546,517</u> | <u>505,488</u> |
| | 1,703,630<br>======= | 1,157,113<br>======= |

සටහන - 12

| <u>වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන</u> | <u>2017</u><br><u>(රු.)</u> | <u>2016</u><br><u>(රු.)</u> |
|---|---|---|
| ආරම්භක ශේෂය | 92,911,215 | 47,972,392 |
| ප්‍රාග්ධන වියදම් | 20,265,122 | 46,346,778 |
| මෙම වසර සඳහා ක්‍රමක්ෂය | <u>(5,633,157)</u> | <u>(1,407,955)</u> |
| | 107,543,180<br>======== | 92,911,215<br>======== |

සටහන - 13

| <u>වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන</u> | <u>2017</u><br><u>(රු.)</u> | <u>2016</u><br><u>(රු.)</u> |
|---|---|---|
| ආරම්භක ශේෂය | 35,829,434 | 44,676,212 |
| භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන | 1,625,000 | 37,500,000 |
| ප්‍රාග්ධන වියදම් | <u>(20,265,122)</u> | <u>(46,346,778)</u> |
| | 17,189,312<br>======== | 35,829,434<br>======== |

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය සඳහා සටහන්

සටහන - 14

| <u>පොලී ආදායම</u> | <u>2017</u><br><u>(රු.)</u> | <u>2016</u><br><u>(රු.)</u> |
|---|---|---|
| ඉතුරුම් ගිණුම්වලින් ලද පොලිය | 22,342 | - |
| ස්ථාවර තැන්පතු පොලිය | - | 16,798 |
| බැංකු ගණුදෙණුවලින් ලද පොලිය | 4,548,366 | 3,383,464 |
| කාර්යමණ්ඩලය වෙත ලබා දෙන ලද ණය සහ අත්තිකාරම්හි පොලිය | <u>41,283</u> | <u>31,582</u> |
| | 4,611,991<br>======= | 3,431,844<br>======= |

සටහන - 15

| <u>පෞද්ගලික පඩි නඩි</u> | <u>2017</u><br><u>(රු.)</u> | <u>2016</u><br><u>(රු.)</u> |
|---|---|---|
| <u>අධ්‍යයන</u> | | |
| <u>වැටුප් සහ වේතන</u> | | |
| වැටුප් සහ වේතන | 2,542,144 | 1,613,294 |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 404,010 | 307,862 |
| විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් | 461,725 | 299,024 |
| සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල 3% | 173,147 | 122,422 |
| බාහිර කථිකාචාර්ය ගාස්තු | 841,250 | 855,650 |
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කථිකාචාර්ය ගාස්තු | <u>290,000</u> | <u>22,500</u> |
| | 4,712,276<br>======= | 3,220,752<br>======= |
| <u>වෙනත් දීමනා</u> | | |
| අධ්‍යයන දීමනාව | 2,624,384 | 2,135,963 |
| පර්යේෂණ දීමනාව | 599,254 | 623,707 |
| ජීවන වියදම් දීමනාව | 343,200 | 296,400 |
| විශේෂ දීමනාව | - | 322,659 |
| අතිරේක දීමනා | 689,016 | 322,659 |
| විනෝදාස්වාද දීමනාව | 113,460 | 81,170 |
| ගැලපුම් දීමනාව | 633,316 | - |
| අතුරු දීමනාව | - | 380,000 |
| වෙනත් දීමනා | <u>600,000</u> | <u>360,000</u> |
| පෞද්ගලික වැටුප් සහ දීමනා - අධ්‍යයන | 10,314,906 | 7,743,310 |

| අනධ්‍යයන | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| වැටුප් හා වේතන | | |
| වැටුප් හා වේතන | 2,432,719 | 1,720,579 |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 316,753 | 205,086 |
| විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් | 228,162 | 150,298 |
| සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල 3% | 109,224 | 71,077 |
| වැඩබැලීම වෙනුවෙන් ගෙවීම් | 200,000 | - |
| | 3,286,859 | 2,147,040 |
| වෙනත් දීමනා | | |
| පර්යේෂණ දීමනාව | 141,729 | 80,389 |
| ජීවන වියදම් දීමනාව | 667,940 | 648,649 |
| විශේෂ දීමනාව | - | 344,116 |
| අතිරේක දීමනාව | 29,013 | 344,116 |
| අතුරු දීමනාව | - | 831,602 |
| MCA | 615,554 | 344,116 |
| ගැලපුම් දීමනාව | 45,835 | - |
| | 1,500,071 | 2,592,988 |
| පෞද්ගලික වැටුප් සහ දීමනා - අනධ්‍යයන | 4,786,929 | 4,740,028 |
| අතිකාල දීමනා සහ නිවාඩු සඳහා ගෙවීම් | | |
| අතිකාල දීමනා | 276,704 | 167,129 |
| නිවාඩු සඳහා ගෙවීම් | 38,419 | 10,124 |
| | 315,123 | 177,253 |
| මුළු පෞද්ගලික වැටුප් සහ දීමනා | 15,416,958 | 12,660,591 |

සටහන - 16

| ගමන් වියදම් | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| දේශීය | 94,331 | 70,314 |
| | 94,331 | 70,314 |
| | ====== | ===== |

සටහන - 17

| සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| ලිපිද්‍රව්‍ය සහ කායර්ාල අවශ්‍යතා | 699,900 | 552,888 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 229,600 | 210,600 |
| කාර්මික සහ විද්‍යුත් භාණ්ඩ | 4,900 | 10,663 |
| නිල ඇඳුම් | 1,800 | 4,973 |
| වෙනත් | 38,709 | 8,221 |
| | 974,909 | 787,345 |
| | ====== | ====== |

සටහන - 18

| නඩත්තු වියදම් | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| උපාංග, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 238,931 | 52,476 |
| ගොඩනැගිලි සහ සැකසුම් | 19,577 | 24,817 |
| වෙනත් නඩත්තු වියදම් | 1,840 | 290 |
| | 260,348 | 156,944 |
| | ====== | ====== |

සටහන - 19

| කොන්ත්‍රාත් සේවා | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| පිරිසිදු කිරීමේ සේවා | 294,350 | 131,837 |
| ආරක්ෂක සේවා | 378,152 | 192,259 |
| තැපැල් ගාස්තු | 78,910 | 80,055 |
| විදුලි සංදේශ | 186,395 | 209,690 |
| විදුලිය | 10,153 | 89,217 |
| ජලය | 8,741 | 19,420 |
| මුද්‍රණ ප්‍රචාරණය | 497,908 | 132,351 |
| | 1,454,608 | 854,828 |
| | ======= | ====== |

සටහන - 20

| <u>වෙනත් උපචිත වියදම්</u> | **<u>2017</u>** <br> <u>(රු.)</u> | **<u>2016</u>** <br> <u>(රු.)</u> |
|---|---|---|
| මුද්දර ගාස්තු | **4,900** | **3,025** |
| විශේෂ සේවා - පීඨ සභාව සහ කමිටු | **717,971** | **670,777** |
| වෘත්තීය සහ වෙනත් ගාස්තු | **10,000** | **140,000** |
| වැඩමුළු, සම්මන්ත්‍රණ | **167,901** | **167,612** |
| කාර්යමණ්ඩල රක්ෂණය | **28,278** | **16,843** |
| කාර්යමණ්ඩල සංවර්ධනය | **109,000** | **74,000** |
| විශ්වවිද්‍යාල ගුරුවරුන් සඳහා ගමන් වියදම් | **137,500** | **-** |
| නිවාඩු ගමන් බලපත්‍ර සහ වාර ප්‍රවේශ පත්‍ර | **8,550** | **-** |
| විනෝදාස්වාද වියදම් | **129,462** | **36,566** |
| බැංකු ගාස්තු | **25,539** | **14,829** |
| දායකත්ව මුදල් සහ සාමාජික ගාස්තු | **35,500** | **24,371** |
| විභාග ගාස්තු | **272,400** | **179,985** |
| කෙටි කාලීන පාඨමාලා වියදම් | **1,352,435** | **54,401** |
| සේවක සුබසාධනය | **-** | **5,000** |
| දේපල ණය පොලී | **93,910** | **-** |
| වෙනත් | **<u>1,787,616</u>** | **<u>885,703</u>** |
| | **4,880,962** <br> ======= | **2,273,112** <br> ======= |

## 2017-12-31 දිනට ශේෂ පිරික්සුම

| ගිණුම | ගිණුමේ නම | බැර | හර |
|---|---|---|---|
| 111001 | වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන | | 107,543,180 |
| 111007 | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන - ගොඩනැගිලි | | 3,672,322 |
| 111008 | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන - පොත් | | 2,917,767 |
| 111009 | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන - යන්ත්‍ර | | 10,142,224 |
| 111011 | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන – මානව සම්පත් | | 257,000 |
| 111010 | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන - පුනරුත්ථාපන | | 200,000 |
| | ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | | 5,633,157 |
| 121005 | පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සාමාන්‍ය සංචිතය | | 18,511,383 |
| 122001 | පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | | 1,703,630 |
| 161004 | රඳවා තබාගැනීම් - ඉදිකිරීම් | | 2,011,359 |
| 161008 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය – ගෙවිය යුතු ගිණුම | | 92,317 |
| 162001 | උපචිත වියදම් | | 1,532,306 |
| 162002 | සුළු ණයහිමියන් | | 2,782,744 |
| 166011 | පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සංවර්ධන අරමුදල | | 3,967,500 |
| 168100 | 1 කලින් ලද පංති ගාස්තු - TESL | | 2,479,925 |
| 168100 | 3 කලින් ලද නිබන්ධන ගාස්තු | | 4,111 |
| 168100 | 5කලින් ලද අමතර ගාස්තු | | 90,450 |
| 168100 | 6 කලින් ලද ලියාපදිංචි ගාස්තු | | 140,550 |
| 168200 | 1 කලින් ලද පංති ගාස්තු - TL | | 1,021,800 |
| 168200 | 4 කලින් ලද අමතර ගාස්තු | | 21,000 |
| 168200 | 5 කලින් ලද ලියාපදිංචි ගාස්තු | | 28,300 |
| 210102 | ප්‍රාග්ධන ස්වරූපයේ ගොඩනැගිල්ල | 91,591,024 | |
| 210201 | කාර්යාලීය ගෘහභාණ්ඩ | 2,537,671 | |
| 210202 | කාර්යාල උපකරණ | 2,027,574 | |
| 210207 | උපාධි ලෝගු හා මාල | 21,000 | |
| 210210 | පොත් හා කාලීන සඟරා | 2,782,233 | |
| 210213 | යන්ත්‍ර හා සවිකිරීම් | 7,878,631 | |
| 210225 | පරිගණක හා උපාංග | 5,640,486 | |
| 210226 | වෙනත් වත්කම් | 67,457 | |
| 210227 | පරිගණක මෘදුකාංග | 482,992 | |
| 210228 | වත්කම් නැවත තක්සේරු කිරීම | 1,590,400 | |
| 210229 | හිඟ ගිණුම නැවත තක්සේරු කිරීම | 2,428,962 | |

| | | | |
|---|---|---|---|
| 210306 | මානව ප්‍රාග්ධන සංවර්ධනය | 168,000 | |
| 221001 | අධ්‍යයනාංශය සඳහා ප්‍රතිපාදන - ගොඩනැගිල්ල | | 6,786,090 |
| 221002 | අධ්‍යයනාංශය සඳහා ප්‍රතිපාදන - කායර්ාල උපකරණ | | 339,610 |
| 221003 | අධ්‍යයනාංශය සඳහා ප්‍රතිපාදන - ගෘහභාණ්ඩ | | 223,335 |
| 221008 | අධ්‍යයනාංශය සඳහා ප්‍රතිපාදන - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | 137,953 |
| 221010 | අධ්‍යයනාංශය සඳහා ප්‍රතිපාදන - පොත් හා කාලීන සඟරා | | 2,188,529 |
| 221011 | අධ්‍යයනාංශය සඳහා ප්‍රතිපාදන - උපාධි ලෝගු හා මාල | | 15,488 |
| 221014 | අධ්‍යයනාංශය සඳහා ප්‍රතිපාදන - පරිගණක හා උපාංග | | 184,907 |
| 221015 | අධ්‍යයනාංශය සඳහා ප්‍රතිපාදන - වෙනත් වත්කම් | | 37,108 |
| 221016 | අධ්‍යයනාංශය සඳහා ප්‍රතිපාදන – පාපැදිය | | 1,000 |
| 231000 | 2 මහජන බැංකුව, නුගේගොඩ 174100156838310 | 252,645 | |
| 231000 | 3 මහජන බැංකුව, නුගේගොඩ 174100246838310 | | 902,000 |
| 231000 | 4 මහජන බැංකුව, නුගේගොඩ 174100336838310 | 123,950 | |
| 231000 | 5 මහජන බැංකුව, නුගේගොඩ 17420022683 | 9,941,809 | |
| 231000 | 6 මහජන බැංකුව, නුගේගොඩ 17420013683 | 2,003,958 | |
| 235004 | පෙර ගෙවීම් | 36,146,23 | |
| 235100 | 1 ලැබිය යුතු පංති ගාස්තු - TESL | 3,558,275 | |
| 235100 | 2 ලැබිය යුතු කළඹ ගාස්තු - T | 72,000 | |
| 235100 | 3 ලැබිය යුතු නිබන්ධන ගාස්තු | 541,918 | |
| 235100 | 4 ලැබිය යුතු විභාග ගාස්තු | 120,000 | |
| 235200 | 1 ලැබිය යුතු පංති ගාස්තු - TLS | 674,400 | |
| 235200 | 2 ලැබිය යුතු නිබන්ධන ගාස්තු | 70,200 | |
| 235200 | 3 ලැබිය යුතු විභාග ගාස්තු | 28,860 | |
| 236001 | ආපදා ණය | 1,182,477 | |
| 236004 | රථවාහන ණය | 30,900 | |
| 236006 | විශේෂ අත්තිකාරම් | 500 | |
| 236007 | උත්සව අත්තිකාරම් | 2,500 | |
| 2396 | ආයෝජන – බැංකු කටයුතු | 46,761,464 | |
| 2398 | භාණ්ඩ ලේඛන | 313,296 | |

| | | | | |
|---|---|---|---|---|
| 3101 | | උපචිත වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රදාන | | 18,727,098 |
| 31010 | | ඉතුරුම් මඟින් පොලිය | | 22,342 |
| 3107 | | ආයෝජන මඟින් පොලිය - බැංකු කටයුතු | | 4,548,366 |
| 3108 | | ණය මඟින් පොලිය | | 41,283 |
| 3113 | | විවිධ ආදායම් | | 65,560 |
| 3118 | | ටෙන්ඩර් ගාස්තු | | 36,000 |
| 3138 | | කලින් ලද පොලී ගාස්තු | | 288,404 |
| 320101 | | TESL පන්ති ගාස්තු | | 4,892,025 |
| 320102 | | TESL ලියාපදිංචි කිරීම් | | 165,525 |
| 320103 | | TESL අමතර ගාස්තු | | 109,800 |
| 320104 | | TESL විභාග ගාස්තු | | 269,850 |
| 320105 | | TESL නිබන්ධන ගාස්තු | | 1,259,039 |
| 320106 | | TESL කළඹ ගාස්තු | | 72,000 |
| 320107 | | අයදුම්පත්‍ර ගාස්තු - TESL | | 167,000 |
| 320201 | | TLSC පන්ති ගාස්තු | | 2,556,450 |
| 320202 | | TLSC ලියාපදිංචි කිරීමේ ගාස්තු | | 64,000 |
| 320203 | | TLSC අමතර ගාස්තු | | 48,000 |
| 320204 | | TLSC විභාග ගාස්තු | | 95,940 |
| 320205 | | TLSC නිබන්ධන ගාස්තු | | 117,000 |
| 320206 | | අයදුම්පත්‍ර ගාස්තු - TLSC | | 66,000 |
| 320301 | | කෙටි පාඨමාලාව | | 3,076,400 |
| 320401 | | දර්ශනපති උපාධි පාඨමාලා අයදුම්පත්‍ර හා යෝජනා | | 69,000 |
| 410104 | | පෞද්ගලික පඩි නඩි - අධ්‍යයන | | |
| | 4101 | වැටුප් හා වේතන | 2,542,144 | |
| | 4102 | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 404,010 | |
| | 4103 | විශ්‍රාම වැටුප් | 461,725 | |
| | 4104 | සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල | 173,147 | |
| | 4105 | වැඩබැලීම සඳහා ගෙවීම් | 200,000 | |
| | 4107 | පර්යේෂණ දීමනාව | 599,254 | |
| | 4108 | අධ්‍යයන දීමනා | 2,624,384 | |
| | 4110 | වෙනත් දීමනා | 600,000 | |
| | 4111 | බාහිර කථිකාචාර්ය ගාස්තු | 841,250 | |
| | 4112 | පාරිතෝෂික | 546,517 | |
| | 4114 | පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කථිකාචාර්ය ගාස්තු | 290,000 | |
| | 4120 | ජීවන වියදම් දීමනාව | 343,200 | |
| | 4122 | අතිරේක දීමනාව | 689,016 | |

| | | | |
|---|---|---|---|
| | 4123 | ගැලපුම් දීමනාව | 633,316 |
| 410104 | | පෞද්ගලික පඩි නඩි - අනධ්‍යයන | |
| | 4201 | වැටුප් හා වේතන | 2,432,719 |
| | 4202 | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 316,753 |
| | 4203 | විශ්‍රාම වැටුප් | 228,162 |
| | 4204 | සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල | 109,224 |
| | 4207 | පර්යේෂණ දීමනාව | 141,729 |
| | 4208 | අතිකාල දීමනා | 276,704 |
| | 4209 | නිවාඩු සඳහා ගෙවීම් | 38,419 |
| | 4210 | වෙනත් දීමනා | - |
| | 4220 | ජීවන වියදම් දීමනාව | 667,940 |
| | 4221 | MCA | 615,554 |
| | 4222 | අතිරේක දීමනාව | 29,013 |
| | 4223 | ගැලපුම් දීමනාව | 45,835 |
| 410105 | | ප්‍රවාහන සහ යැපුම් | - |
| | 501 | දේශීය | 94,331 |
| 410106 | | සැපයුම් | |
| | 601 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 699,900 |
| | 602 | ඉන්ධන හා ලිහිසි තෙල් | 229,600 |
| | 603 | නිල ඇඳුම් හා මැසීමේ කායර්යන් සඳහා ගාස්තු | 1,800 |
| | 604 | යාන්ත්‍රික සහ විද්‍යුත් උපකරණ | 4,900 |
| | 607 | වෙනත් සැපයුම් | 38,709 |
| 410107 | | නඩත්තු | |
| | 701 | වාහන | 1,840 |
| | 702 | යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ හා උපාංග | 238,931 |
| | 703 | ගොඩනැගිල්ල හා සැකසුම් | 19,577 |
| 410108 | | කොන්ත්‍රාත් සේවා | |
| | 802 | විදුලි සංදේශ | 176,005 |
| | 803 | තැපැල් ගාස්තු | 89,300 |
| | 804 | විදුලිය | 10,153 |
| | 805 | ආරක්ෂක සේවා | 378,152 |
| | 806 | ජලය | 8,741 |
| | 807 | පිරිසිදු කිරීමේ සේවා | 294,350 |
| | 810 | මුද්‍රණ හා ප්‍රචාරණ යනාදිය | 497,908 |
| 410109 | | වෙනත් උපචිත වියදම් | |
| | 901 | විශ්වවිද්‍යාලය වෙත සංචාර ප්‍රදාන | 137,500 |
| | 902 | විශේෂ සේවා - පීඨ සභාව | 717,971 |
| | 903 | විශේෂ සේවා - වෘත්තීය | 10,000 |

| | | | | |
|---|---|---|---|---|
| | **904** | වැඩමුළු, සම්මන්ත්‍රණ | **167,901** | |
| | **906** | කාර්යමණ්ඩල සංවර්ධනය | **109,000** | |
| | **907** | පශ්චාද් උපාධි පර්යේෂණ | **30,785** | |
| | **915** | නිවාඩු ගමන් වාර බලපත්‍ර | **8,550** | |
| | **916** | විනෝදාස්වාද වියදම් | **242,922** | |
| | **917** | බැංකු ගාස්තු | **25,539** | |
| | **919** | දායකත්ව හා සාමාජික ගාස්තු | **35,500** | |
| | **921** | විභාග වියදම් | **272,400** | |
| | **922** | වෙනත් - පුවත්පත්, සඟරා | **1,606,832** | |
| | **925** | දේපල ණය පොලිය | **93,910** | |
| | **926** | මුද්දර ගාස්තු | **4,900** | |
| | **927** | කාර්යමණ්ඩල රක්ෂණාවරණය | **28,278** | |
| | **929** | විගණන ගාස්තු | **150,000** | |
| | **930** | නැවත තක්සේරු කිරීමේ පාඩුව - දේපල හා ඉඩම | **-** | |
| | **931** | අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | **107,008** | |
| **410118** | | වත්කම් අවප්‍රමාණය කිරීම | **5,658,457** | |
| **490101** | | කෙටි පාඨමාලා වියදම | **1,352,435** | |
| | | | **212,326,127** | **212,326,127** |

## 7. විගණකාධිපතිවරයාගේ වාර්තාව


විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/ජී/පීජීඅයිඊ/1/17

මබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 සැප්තැම්බර් 24දින

අධ්‍යක්ෂ
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය

**ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

(අ) ප්‍රමිතයේ 42 ඡේදය ප්‍රකාරව සියයට 100 ක් ක්ෂය කර ඇති වත්කම්වල සාධාරණ අගයන් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු වුවද ආයතනය විසින් 2017 ජනවාරි 01 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති පිරිවැය රු.479,508 ක් වූ පොත් හා වාර ප්‍රකාශන වලින් තව දුරටත් භාවිතා කරනු ලබන පොත් හා වාර ප්‍රකාශනවල සාධාරණ අගය (Fair Value) ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ 86 වන ඡේදය ප්‍රකාරව සියලු ස්ථාවර වත්කම්වල වාර්ෂික ක්ෂය අනුපාතයන් හෙළිදරව් කළ යුතු වුවද ආයතනයේ යන්ත්‍ර සහ සවිකිරීම් (Plant and Machinery) වල ක්ෂය අනුපාතය එසේ හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන වටිනාකම රු.46,761,464 ක් වූ අතර උපලේඛනවලට අනුව එම වටිනාකම රු.47,031,800 ක් වුයෙන් රු.270,336 ක පැහැදිලි නොකල වෙනසක් විය.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහය XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීම සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. පැමිණීම තහවුරු කරගැනීමකින් තොරව 2017 වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබූ මුදල රු.9,183,656 ක් විය. |
| (ආ) | 2011 ජනවාරි 27 දිනැති අංක PED 56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | යම් රාජ්‍ය ආයතනයක අතිරික්ත අරමුදල් පවතී නම් ඉදිරි මාස 06 සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය හැර ඉතිරිය භාණ්ඩාගාරය වෙත යැවිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.10,110,775 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,584,286 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,526,489 ක වර්ධනයක් සිදුවී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.6,541,098 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.3,413,496 ක් වූ අතිරික්තය 2014 වර්ෂයේදී රු.2,400,723 ක් දක්වා පිරිහී තිබූ අතර එතැන් සිට අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය වන විට රු.10,110,775 ක් වී තිබුණි. ඉහත අතිරික්තයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමේදී 2013 වර්ෂයේදී රු.8,819,530 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු.21,075,415 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

ඉංග්‍රීසි ඉගැන්වීමේ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම පෙරදැරි කරගෙන රටේ සංවර්ධනය සඳහා දායක වන මූල්‍යමය හැකියාවක් ඇති ආයතනයක් බිහිකිරීමේ අරමුණෙන් 2006 වසරේදී මෙම ආයතනය ස්ථාපිත කර තිබුණි. ආයතනය ආරම්භ කළ 2006 වසරේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ පශ්චාත් උපාධි පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවලින් 39 හා 09 ක් විය.පසුගිය වසර 03 ක කාලය තුළ කිසියම් ප්‍රගතියක් දක්නට ලැබුණද ආයතනයේ ආරම්භක අරමුණු ඉටුකර ගැනීමට සිදුකර ඇති දායකත්වය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමට තවදුරටත් නොහැකි වී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

විවෘත විශ්වවිද්‍යාලයට අයත් ඉඩමක අයිතිය නිත්‍යානුකූලව ලබා නොගෙන රු.91,591,024 ක් වැයකර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර තිබුණි.

### 4.3 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාර්ෂිකව භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා ලද මුදල් වලින් අදාළ වර්ෂයන්හි උපයෝජනය නොකළ ප්‍රදානයන් සැලකිල්ලට නොගෙන නැවත නැවතත් ඉල්ලීම් කර ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් ලබාගෙන තිබුණි. ඒ හේතුවෙන් 2015, 2016 සහ 2017 වර්ෂවල එලෙස භාණ්ඩාගාරයෙන් ලද මුදල් වලින් පිළිවෙලින් රු.44,676,212 ක්,

රු.35,829,434 ක් හා රු.17,189,312 ත් ඉතිරිව පැවතුණි. මෙලෙස ඉතිරි වූ මුදලින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.46,761,464 ක් කෙටිකාලීන ආයෝජනවල යොදවා තිබුණි.

(ආ) ආයතනයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් දැරීමට සිදුවන කාලසීමාවන් පුරෝකථනය කර ඒ අනුව කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය හඳුනාගෙන අතිරික්ත මුදල් ශේෂයන් කෙටිකාලීන ආයෝජනයන්හි යෙදවීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 03 කට ආසන්න ශේෂයක් බැංකු ජංගම හා ඉතිරිකිරීමේ ගිණුම්වල අඛණ්ඩව පැවතුණි.

### 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.10,314,906 ක් ගෙවා තිබුණි. එහෙත් ආයතනය විසින් පවත්වන ලද දේශන, වැඩමුළු හා සම්මන්ත්‍රණ වලින් සියයට 85 කටත් අධික ප්‍රමාණයක් පවත්වා තිබුණේ සති අන්ත දිනවලය. ඒ සඳහා බාහිර දේශකවරුන්ට රු.841,250 ක් ආයතනයේ දේශකවරුන්ට රු.290,000 ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අතිකාල දීමනා ලෙස රු.276,704 ක් ගෙවා තිබුණි.

(ආ) ආයතනය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම දේශන පැවැත්වීම සති අන්ත දිනවල සිදුකර තිබුණි. ඒ අනුව අනෙකුත් විශ්වවිද්‍යාල මෙන් සතියේ දිනවල අධ්‍යයන කාර්ය මණ්ඩලය දේශනාවල නියැලී නොමැති බවත් මුළු දේශකවරුන්ගෙන් සියයට 75 ඉක්මවූ දායකත්වයක් බාහිර දේශකවරුන් ගෙන් ලැබී ඇති බවත් නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

විවෘත විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් මෙම ආයතනයේ විගණනය සිදුකළද මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු නොකිරීම වැනි අඩුපාඩු අවම කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණනය සැලසුම් කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛණමය පාලනය

අයවැය ගත ආදායම් හා වියදම් සහ තත්‍ය ආදායම් හා වියදම් අතර සියයට 60 සිට සියයට 307 දක්වා ප්‍රමාණාත්මක විචලනයක් දක්නට ලැබුණු බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර නොමැති බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) මූල්‍ය පාලනය | i. ප්‍රාග්ධන ප්‍රදාන නිසිපරිදි උපයෝගි කර නොතිබීම.<br>ii. අතිරික්ත මුදල් කෙටිකාලීන ආයෝජන වල නොයෙදීම. |
| (ආ) අභ්‍යන්තර විගණනය | ආයතනයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණනය උපයෝගී කර ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබීම. |
| (ඇ) අයවැය පාලනය | පසුගිය වර්ෂවල ආදායම් හා වියදම් සමාලෝචනය කර ඇස්තමේන්තු සකස් කර නොතිබීම. |
| (ඈ) වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතැම් වත්කම්වල මිලදීගත් දිනය, පිරිවැය සටහන් කර නොතිබීම සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන් අතර නොසැසඳීම් පැවතීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# 8. විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු


PGIE
POST GRADUATE INSTITUTE OF ENGLISH

Postgraduate Institute of English
The Open University of Sri Lanka
P.O. Box 21
Nawala
Nugegoda

Telephone: 011-2825805, 2825806, 2881027, 2881032, 2853777
Director: Ext. 528, SAR: Ext. 527 AB: Ext. 532


2018 නොවැම්බර් 19 *Your ref* : HED/G/PGIE/1/17

විගණකාධිපති,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

<u>පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

ඔබ විසින් යොමු කරන ලද 2018 සැප්තැම්බර් 28 දිනැති වාර්තාවට පිළිතුරු වශයෙනි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

(අ) ආයතනයේ පොත්පත් වාර සඟරා ප්‍රත්‍යාගනය කිරීම සඳහා 2017.11.17 දින කමිටුවක් පත්කර ඇති අතර 2018 වර්ෂය තුළ අදාළ කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත.

(ආ) ආයතනයේ යන්ත්‍ර හා සවි කිරීම් 20% ක්ෂය අනුපාතයෙන් ක්ෂය කර ඇති අතර ක්ෂය අනුපාතය 20% බව ගිණුම්කරණ සටහන් තුල දැක්වීමට නොහැකි වී ඇත. ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්**

මෙම වෙනසට හේතු වී ඇත්තේ භාන්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමෙන් ලද පොලී ආදායම ගිණුම් තුල වෙන්කර නොදැක්වීම හේතුවෙනි. මෙය නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවා කාලය පෙරවරු 8 පස්වරු 4 අතර කාල පරාසයකට පමණක් ලඝු කල නොහැකිවේ. ඔවිහු අදාල අධ්‍යන සඳහා සූදානම් විම හා පිළියෙල කිරීම සඳහාද ශිෂ්‍ය ගැටළු හා උපදේශන කටයුතු සඳහාද පාඨමාලා සම්බන්ධ අනෙකුත් කටයුතු සඳහාද ගණනය කළ නොහැකි කාලපරාසයක සේවයේ නිරත වෙති. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පාලනය වන කිසිදු විශ්වවිද්‍යාලයක අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විසින් පැමිණීම සහ පිටවීම සටහන් කිරීමක් සිදු කරනු ලබන බවට තොරතුරු නොමැත.

(ආ) 2015 හා 2016 වර්ෂවල ප්‍රාග්ධන ප්‍රදාන ගනු ලැබුවේ නව ගොඩනැගිල්ල වෙනුවෙන් අදාළ කොන්ත්‍රාත්කරුට ගෙවීම් සිදුකිරීමට හා වත්කම් මිල දී ගැනීම සඳහාය. මෙම ප්‍රාග්ධන ප්‍රදාන 2017 වර්ෂය තුල අවසන් කිරීමට සැලසුම්කර පැවතුණි.

තවද ජූලි 22 පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේ දී මෙන්ම විගණන කමිටුවේ දී වැය නොකල ප්‍රාග්ධන නැවත අදාළ අංශ වෙතට යැවීමට තීරණය කරණ ලදී. මේ සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත.

## 03. මූල්‍ය සමාලෝචනය

### 03.1 මූල්‍ය ප්‍රතිඵලය

පසුගිය වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රුපියල් 3,584,775 වන අතර 2017 වර්ෂයේ එය රු 10,110,775 වේ. මේ අනුව මෙහෙයුම් අතිරික්තය පසුගිය වර්ෂයට වඩා රුපියල් 6,526,486 ඉහළ ගොස් ඇති අතර එය 182% ක වර්ධනයකි.

පසුගිය වර්ෂයට සාපේක්ෂව ක්ෂයවීම් රු.2,002,523 කින් ඉහලගොස් ඇත. තවද සේවක පාරිශ්‍රමික හා ක්ෂයවීම් ඉහලයාම ආයතනයේ පාලනයෙන් බැහැර තත්වයකි.

## 04. මෙහෙයුම් සමාලෝචනය

### 04.1 කාර්ය සාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

කාර්ය සාධනය පිළිබඳ දක්වා ඇති සමස්ත අදහස ආයතනයේ මූල්‍යමය හැකියාවන් මත පමණක් පදනම් වී ඇති බව නිරීක්ෂණය වේ. එහෙත් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ජාතික අවශ්‍යතාවයක් මත ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි අධ්‍යාපනය ප්‍රශස්ත මට්ටමකට යොමු කිරීමට පිහිටුවන ලද ආයතනයකි. මෙම සන්දර්භය තුළ මූල්‍යමය නිර්ණායක මත පමණක් ආයතනයේ කාර්යසාධනය ඇගයීමට ලක් කළ නොහැක.

මීට අමතරව, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වලට අනුබද්ධ පශ්චාද් අධ්‍යයන ආයතන අතුරින් ලාබාලතම (දෙවැනි තැන) ආයතනය මෙයයි. වසර 12 ක කාලයක් ක්‍රියාත්මක වූ ආයතනයක් ලෙස අද වන විට ආයතනයේ ඵලදායීතාවය විවිධ අංශ වලින් නිරූපණය වේ. ඒ පිළිබඳව විස්තර පහත දැක්වේ. තවද, අධ්‍යාපනය යනු දීර්ඝ කාලීන ආයෝජනයක් වන බැවින් ආයෝජනයේ ප්‍රතිඵල පෙන්වීමට යම් කාලයක් ගත වේ.

මෙම ආයතනයේ 2005-2010 කාලසීමාව තුල ලියාපදිංචිය ලබාගත් ශිෂ්‍යයන් හට තම අධ්‍යයන කාලය පිළිබඳ නිශ්චිත කාල සීමාවක් පනවා තිබී නොමැති අතර 2011 වසර සිට ශිෂ්‍යයන් හට අධ්‍යයන කාලය වසර 7 ක කාල සීමාවක් දක්වා වලංගු ය. මීට හේතුව මෙම ආයතනය දුරස්ථ හා විවෘත අධ්‍යාපන ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක වීමය. මෙම ක්‍රමවේදය යටතේ විවෘත විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වන ඕනෑම ශිෂ්‍යකු හට සිය අධ්‍යාපන කටයුතු නිම කිරීමට වසර 07 ක කාලයක් ගතකල හැක. මෙය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ක්‍රමවේදයේ නම්‍යශීලී ගුණාංගයක් වන අතර මේ පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් පහතින් දැක්වේ. පැරණි ලියාපදිංචිය ලබාගත් ශිෂ්‍යයන් ඇතැමෙක් මෙම කාලසීමාව තුල ද තම අධ්‍යයනය අවසන් කර ඇත. එබැවින් ආයතනයේ අධ්‍යයන කටයුතු ව්‍යුහය අනුව නිශ්චිතවම පාඨමාලාවන් හැරගිය ශිෂ්‍ය සංඛ්‍යාවක් ප්‍රකාශ කළ නොහැක.

ඒ අනුව විගණන වාර්තාවේ දක්වා ඇති දත්ත වලින් වර්තමාන තත්ත්වය නිරූපණය නොවේ.

04.2 **කළමනාකරණ ක්‍රියාකාරකම්**

ආයතනයේ ගොඩනැගිල්ල විවෘත විශ්ව විද්‍යාලයේ පාලක සභාව ලබාදුන් ඉඩමේ ගොඩනගා ඇති අතර ආයතනයේ නියමාවලිය අනුව නිශ්චල වත්කම් පවත්වා ගත නොහැකිය. එනිසා ඉඩමේ අයිතිය පිළිබඳ ගැටළුවක් පවතින අතර මේ සඳහා අදාළ අංශ සමඟ සාකච්ඡා කරමින් පවතින අතර මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්කරණ සටහන් මගින් අදාල තොරතුරු ඉදිරිපත්කර ඇත.

4.3 **අරමුදල් ඌන උපයෝජනය**

(අ) 2015 හා 2016 වර්ෂවල ප්‍රාග්ධන ප්‍රදාන ගනු ලැබුවේ නව ගොඩනැගිල්ල වෙනුවෙන් අදාළ කොන්ත්‍රාත්කරුට ගෙවීම් සිදුකිරීමට හා වත්කම් මිල දී ගැනීම සඳහාය. මෙම ප්‍රාග්ධන ප්‍රදාන 2017 වර්ෂය තුල අවසන් කිරීමට සැලසුම්කර පැවතුණි.

තවද 2018 ජුලි 22 පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේ දී මෙන්ම විගණන කමිටුවේ දී වැය නොකල ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳ සාකච්ඡා කර එම වැය නොකල ප්‍රාග්ධන නැවත අදාළ අංශ වෙතට යැවීමට තීරණය කරණ ලදී. ඒ අනුව අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

(ආ) 2017 වර්ෂයේ විගණනය විසින් යෝජනා කර ඇති පරිදි ආදායම් රැස් කිරීමේ ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම සඳහා ඉතිරි කිරීම් ගිණුම් දෙකක් 2017 නොවැම්බර් මස ආරම්භ කරන ලදී. තවද 2017 නොවැම්බර් මස රුපියල් මිලියන 5.1 හා දෙසැම්බර් මස රුපියල් මිලියන 11 භාණ්ඩාගාර බිල්පත් මුදල් කිරීම් මත ආයතනයේ ඉතිරි කිරීම් ගිණුම් ශේෂය ඉහළ ගිය අතර එම මාස දෙක තුළ රුපියල් මිලියන 10 ක වියදම් සිදුකරන ලදී. තවද දෙසැම්බර් මස අවසාන දින වනවිට ඉතිරි කිරීම් ගිණුම් තුල පැවති ශේෂය ආයෝජනය නොකර ගිණුම තුල රඳවා ගත්තේ එම මස පොලී ආදායමක් ලබා ගැනීමේ අරමුණින් වන අතර 2018 වර්ෂය ආරම්භයේ දී භාණ්ඩාගාර බිල්පත්වල නැවත ආයෝජනය කරන ලදී.

04.4 **කාර්ය මණ්ඩල පරිපාලනය**

(අ)(ආ) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ක්‍රමවේදය යටතේ විවෘත විශ්වවිද්‍යාලයේ සිදුකරන ක්‍රියාවලිය පරිද්දෙන්ම පාඨමාලා සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට එන ශිෂ්‍යයන්ගෙන් 90% ට වඩා වැඩි ප්‍රමාණයක් දැනට වෘත්තියක නියැලෙන අය වේ. මෙම ශිෂ්‍යයන් බොහොමයක් දුර බැහැර සිට ආයතනයට පැමිණිය යුතු වන අතර ආසන්නව සිටින අය පවා පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ රැකියා වල නිරත වන නිසා සතියේ දිනවල දිවා කාලයේ පන්ති පැවැත්වීම කළ නොහැකිය.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ක්‍රමවේදය දැනට වෘත්තියක යෙදී සිටින, වෙනත් පවුල් හා සමාජ වගකීම් ඇති වැඩිහිටියන්ට තම අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි අධ්‍යයන කාර්යයන් වල යෙදීමට නම්‍යතාවයක් ලබාදේ. ඒ අනුව පාඨමාලාවන් සඳහා සාමාන්‍ය කාර්යාල වෙලාවන් භාවිත කළ නොහැක. එබැවින් සති අන්ත දින පාසැල් (Day school) වල කටයුතු සඳහා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වලට සති අන්ත ගෙවීම් විවෘත විශ්වවිද්‍යාලයේ මෙන්ම පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ද සිදු වේ.

මීට අමතරව ආයතනයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය සතියේ දිනවල පාඨමාලාවන් සම්බන්ධ සම්බන්ධීකාරක කටයුතු මෙන්ම පාඨමාලාවල න්‍යායික හා ගුණාත්මක වර්ධනයන් පිළිබඳ නිරන්තර යාවත්කාලීන කටයුතු වල නිරත වෙති. ආයතනයේ සියලුම පාඨමාලාවල නිර්ණායක හා ව්‍යුහයන් මේ වන විට සංශෝධනය කොට Sri Lanka Qualification Frame Work හා යාවත්කාලීන කර ඇත. තවද මෙම වසරේ ආරම්භ කිරීමට නියමිත ද්විභාෂා පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා ද වෘත්තීය ඉංග්‍රීසි පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව පාඨමාලාවන් සම්බන්ධ සම්බන්ධීකාරක කටයුතු මෙන්ම අධ්‍යයන පෙලපොත් සැකසීමේ කටයුතු වල නිරත වෙති. මෙම සියලු කටයුතු සතියේ දිනවල සිදුකෙරේ.

## 05. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 05.1 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අභ්‍යනතර විගණන අංශයම පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ද අභ්‍යනතර විගණන කටයුතු සිදු කරයි. අභ්‍යනතර විගණන අංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමානවත් නොවන බව පිළිගන්නා අතර කාර්ය මණ්ඩලය වැඩිකිරීම සඳහා ඉල්ලීම් කර ඇත.

සියලුම අභ්‍යනතර විගණන වාර්තා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ විගණන කමිටුවේ දී සාකච්ඡා කරණු ලබන අතර ඒවා ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය විගණන කමිටුව මගින් සහ අභ්‍යන්තර විගණන අංශය මගින් නිරතුරුව පරීක්‍ෂා වේ.

### 05.2 අයවැය ලේඛනමය පාලනය

පවතින ප්‍රායෝගික තත්වයන් මත සමහර අයවැයගත ආදායම් සහ වියදම් අතර යම් යම් විචලතාවයන් පවතින නමුත් උපරිම වශයෙන් අයවැය ලේඛනයට අනුව කටයුතු කරණු ලැබේ.

## 06. පද්ධති හා පාලන

(අ) අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානයකින් යුතුව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

(ආ) විවෘත විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය සමඟ සාකච්ඡා කර අභ්‍යන්තර විගණන කටයුතු සැලසුම් කිරීමට පියවර ගණුලැබේ.

(ඇ) නිශ්ක්‍රීය බැංකු ශේෂයන් කෙටිකාලීන ආයෝජන වල යොදන්නේ නම් අවම වශයෙන් මාස 03 ක කාලයක්වත් පවත්වා ගත යුතු නිසා ඒ වෙනුවට ඉතිරි කිරීමේ ගිණුම් ආරම්භ කර එමගින් ඉතිරි කිරීමේ පොලී ආදායමක් ලබා ගැනීමට කටයුතු කර ඇත.

(ඈ) ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට කටයුතු කරණු ලැබේ.

Dr. H. S. Rambukwella
PhD (HKU), BA Hons (Pdn,SL)
Director
Postgraduate Institute of English
The Open University of Sri Lanka
Nawala, Nugegoda.

අධ්‍යක්ෂ,
පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය.

පිටපත්

| | | | |
|---|---|---|---|
| 1. | සභාපති | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| 2. | ලේකම් | - | උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය |
| 3. | ලේකම් | - | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| 4. | විගණන අධිකාරී | - | විවෘත විශ්වවිද්‍යාලයීය ශාඛාව |
| 5. | ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක | - | විවෘත විශ්වවිද්‍යාලය |